*Vidyodaya J. of Humanities and Social Sci., (2004) Vol. 1, pp. 171 - 201.*

# ආදි ම මුද්‍රිත ක්‍රිස්තියානි සිංහල සාහිත්‍ය කෘති හා තදීය භාෂා ලක්ෂණ

රත්නසිරි අරංගල
සිංහල හා ජන සන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

සිංහල සාහිත්‍යය ආරම්භයෙහි පටන් ම බෞද්ධ සාහිත්‍යයක් විය. වස්තුවිෂය, සම්ප්‍රදාය හා ආකෘතිය යන අංග විෂයෙහි ලා පාලි හා සංස්කෘත සාහිත්‍යයන් සිංහල සාහිත්‍යය කෙරෙහි බලපෑම් කළ ආකාරය විද්වතුන්ගේ අවධානයට ලක් වී තිබේ. ඇතැම් අංග අතින් සංස්කෘත පද්‍ය සාහිත්‍යයෙහි අනුශාඛාවක් සේ වර්ධනය වූ සිංහල පද්‍ය සාහිත්‍යය පවා කාව්‍ය වස්තුව සඳහා ජාතක පොත කරා යොමු වීමෙන් බෞද්ධ මුහුණුවරක් අත්පත් කොට ගත් ආකාරය පෙන්වා දිය හැකි ය.

ක්‍රිස්තියානි/ කතෝලික ආගම් ප්‍රචාරය උදෙසා සිද්ධ කෙරුණු ධර්ම ග්‍රන්ථ සම්පාදනය හා ශුද්ධ ග්‍රන්ථ පරිවර්තනය දිවයිනේ භාෂා සාහිත්‍ය විෂයයෙහි නව ප්‍රවණතා රාශියක උද්භවයට හේතු වූ ආකාරය දැක ගත හැකි ය. මේ වූ කලි, ව්‍යවහාර වර්ෂ 1500 - 1900 අතර වකවානුවේ දිවයිනෙහි සිදු වූ සමාජ ආර්ථික හා සංස්කෘතික විචල්‍යයන් හේතුවෙන් බිහි වූ මෙකී නව සාහිත්‍යය පිළිබඳ සංක්ෂිප්ත අධ්‍යයනයකි.

මේ අධ්‍යයනයෙහි ලා ක්‍රිස්තියානි සිංහල සාහිත්‍යය යනුවෙන් වෙසෙසා දැක්වෙනුයේ සොළොස් වන සියවසේ පටන්, පෘතුගීසි, ලන්දේසි හා ඉංගිරිසි යන යුරෝපීය ජාතීන් දිවයින පාලනය කළ වකවානුවේ මෙහි විසූ සිංහල උගත් යුරෝපීයයන් මෙන් ම කිතු සමය වැලඳ ගත් සිංහලයන් ද විසින් ක්‍රිස්තියානියේ මූලික සංකල්ප වටහා දීමටත් අන්‍ය ලබ්ධීන් හා ලබ්ධිකයන් (විශේෂයෙන් ම බුදුසමය හා බුදුනුවන්) විවේචනයටත් සම්පාදිත පොතපත යි.

## ලක්දිව පෘතුගීසි පාලන සමයේ ක්‍රිස්තු ධර්ම ප්‍රචාරක කටයුතු

ලක්දිවට මුලින් ම බල පෑ ක්‍රිස්තියානිය වූ කලි කතෝලික නිකායයක් වන ෆ්‍රැන්සිස්කන් නිකාය යි. ඒ සොළොස් වන සියවසේ දී ය. පූර්වයෙහි දු කිතුසමය මෙරට පැවති බවට සාධක වශයෙන් අනුරාධපුරයෙන් හමු වූ ගලින් කරන ලද කුරුසයක් පිළිබඳ ව සඳහන් කෙරෙතත් එහි කාල නිර්ණය පිළිබඳ මත භේද පවතී. ෆ්‍රැන්සිස්කන් නිකායට පසු ව ඩොමිනිකන්, ඔගස්ටීනියන් හා ජෙසුයිට් යන කතෝලික නිකාය දිවයිනේ ක්‍රියාත්මක වී ය.[2] ලක්දිව ලන්දේසි සමය තුළ (ව්‍යවහාර වර්ෂ 1658 - 1796) ක්‍රියාත්මක වූ නිල ක්‍රිස්තියානිය වූයේ රෙපරමාදුවාදය යි. තදනන්තර ව බ්‍රිතාන්‍ය පාලන සමයෙහි දී ප්‍රොතෙස්තන්ත සභාව (1804), බැප්ටිස්ට් සභාව (1812), වෙස්ලියානු ධර්මදූත සභාව (1814) හා විදේශ ධර්මදූතායතනය සඳහා වන අමෙරිකානු අධිකාරීන්ගේ මණ්ඩලය (1818) යන ක්‍රිස්තියානි නිකාය කිහිපය දිවයිනෙහි ලබ්ධි ප්‍රචාරණයෙහි නිරත විය.[3]

---

1. Quere, M., (1984), "Fransis Xavier and Sri Lanka", *Aquinas Journal*, 1.1: 161 -176; අබයසිංහ, ටිකිරි, (1969), **පෘතුගීසීන් හා ලංකාව**, කොළඹ: 102.
2. අබයසිංහ, (1969), එහි ම.
3. de Silva, K.M.,(1973), "Religion and State in Early Nineteenth Century", *U.C.H.C.*, Vol. III, Pt.I, Ch. V: 66-76.

සොළොස් වන සියවසේ දී ලංකාවට පැමිණි පෘතුගීසීහු දිවයිනේ පළාත් කිහිපයක සිය පාලන බලය පැතිරවීමෙන් අනතුරු ව කිතුසමය ප්‍රචාරය ආරම්භ කළහ. ෆ්‍රැන්සිස්කන් නිකායිකයන් විසින් අරඹන ලද මේ කාර්යයට දෙවනු ව ජේසුයිට් නිකායිකයෝ ද තදනන්තර ව ඔගස්ටීනියන් හා ඩොමිනිකන් පූජකයෝ ද සම්බන්ධ වූහ.[4] ස්වකීය ලබ්ධිය පතුරුවන දේශයේ ව්‍යවහාර භාෂා පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් තිබීම ධර්මදූතයකු සතු මූලික සුදුසුකමක් විය යුතු බව තත්කාලීන පාප්වරයකු වූ පසළොස් වන බෙනඩික්ට් පියතුමාගේ ආඥාව විණැයි කියනු ලැබේ.[5] පෘතුගීසීන් සමඟ ඉන්දියාවට පැමිණි කතෝලික පූජකයන් සංස්කෘත හා දෙමළ ආදි භාෂාවන්හි පෘථුලාවබෝධයක් අත්පත් කොට ගැනීමෙහි ලා උත්සුක වූ බවත් ඔවුන් නූතන භාරතීය ශාස්ත්‍ර ප්‍රබෝධයෙහි පදනම ලූ බවත් ප්‍රකට ය.[6] එසේ ද වුව ලක්දිව ආදිතම කතෝලික පූජකයෝ භාෂා ශාස්ත්‍ර සම්බන්ධ දැනුම අතින් පූර්ණත්වයට පත් වූවෝ නො වූහ. ලබ්ධි ප්‍රචාරණය සඳහා ප්‍රමාණවත් වන සන්නිවේදන ශක්‍යතාවක් අත්පත් කොට ගැනීමෙන් ඔවුන් තෘප්තිමත් වූ බව පෙන්වා දිය හැකි ය. තත් කාර්ය සාධනය සඳහා ප්‍රයෝජනවත් වන අන්දමේ ශබ්දකෝෂ හා ව්‍යාකරණ ග්‍රන්ථ සම්පාදනයෙහි ඔවුන් යුහුසුලු වූ බව පෙනේ.[7] සොළොස් වන සියවස්හි පටන් කතෝලිකයන් (පෘතුගීසීන්) විසින් පාඨශාලා ආරම්භ කරන ලද අතර[8] ඒවායේ භාවිතය සඳහා පොතපත ද සම්පාදනය කෙරිණි.[9] මේ කාර්යයන්හි ලා මූලිකත්වය ඉසුලුවෝ ජේසුයිට් නිකායික පූජකයෝ ය.[10] මල්වානේ විසූ ජේසුයිට් නිකායික පූජකයකු වූ Luis Mattheus Pelingotti (1579-1616) නමැති ඉතාලි ජාතිකයා විසින් 1610 දී සිංහලයකුගේ ද සහායයෙන් කථෝපකථනයක්, සාන්තුවරයන් සවිසි දෙනකුගේ චරිතාපදාන, දෙවියන් වහන්සේගේ දුක්ඛප්‍රාප්තිය සහ මරණය යනාදි ග්‍රන්ථාවලියක් සම්පාදිත බව කියනු ලැබේ.[11] මොහුට මේ සඳහා සිංහල ඉගැන්වූ තැනැත්තා සයිමන් ද කොරෙයා නම් අයකු වූහ යි ද පැවසේ.[12] සොළොස් වන සියවසේ මැද භාගයේ දී ම කොළඹ ශුද්ධ වූ පාවුලු විද්‍යාලයයේ ජේසුයිට් නිකායික පූජකයන් විසින් ද කිතු දහමේ මූලිකාංග පිළිබඳ කුඩා පොතක් සිංහලයෙන් පළ කරනු ලැබ ඇත.[13] මේ සියලු ම පොතපත දිවයිනේ සාම්ප්‍රදායික ග්‍රන්ථ නිෂ්පාදන තාක්ෂණය අනුයමින් සම්පාදිත යි.

රෝමානු කතෝලික පූජකයන්ට කුඩා ධර්මග්‍රන්ථ හා පාසල්වල භාවිතයට අවශ්‍ය පුස්තිකා සම්පාදනයෙන් සෑහීමට පත් වීමට සිදු වූ බැවින් බයිබල පරිවර්තනය වැනි භාරදූර කාර්යයකට අත ගැසීමට අවකාස නො සැලසුණු බව පෙන්වා දිය යුතු ය. එසේ ද වුව ඔවුන් විසින් දමන ලද පදනම හේතුවෙන් පසු කල බයිබල පරිවර්තකයන්ගේ කාර්යසාධනය වඩාත් පහසු වූ සේ සැලකේ. ඕලන්ද යුගයේ

---

4. පීරිස්, එඩ්මන්ඩ්, (19??), **සිංහල ක්‍රිස්තියානි සාහිත්‍ය වංශය** -(දස හවන සියවසේ සිට දස අට වන සියවස දක්වා), කොළඹ: 2.
5. එහි ම.
6. එම, 1.
7. Peiris, Edmund, (19?), "A Portuguese - Tamil - Sinhalese Dictionary of the XVIIIth Century", *Ceylon Literary Register*, Vol. 1, No 12: 539-40.
8. අබයසිංහ. ටිකිරි, (1966), පරංගි කෝට්ටේ 1594 -1612, කොළඹ: 178, 198-99.
9. පීරිස්, පෙර කී ග්‍රන්ථය: 2.
10. අබයසිංහ, (1966) :197-199.
11. Perera, S.G.,(1941), *The Jesuits in Ceylon* (in the xvi and xvii centuries), Madura: 51, 161.
12. ibid, 51.
13. Perera, S.G.,(1915), "The Jesuits in Ceylon in the 16th and the 17th Centuries", *Ceylon Antiquary and Literary Register*, Vol.1: 220.

සිංහල බයිබල පරිවර්තන විමසන කල ප්‍රකට වන කරුණක් නම් නව ආගමික සංකල්ප ප්‍රකාශ කිරීමෙහි ලා පෘතුගීසි වාඞ්මාලාවක් උපයෝගි කොට ගෙන ඇති ආකාරය යි.[14] ක්‍රිස්තුධර්මය හා අදාළ සංකල්ප ප්‍රකාශනයෙහි ලා සිංහලයෙහි භාවිත වාංමාලාවෙන් වැඩි කොටස පෘතුගීසි මූලයක් සහිත බව කිව හැකි ය.[15]

## ලක්දිව ලන්දේසි පාලන සමයේ ක්‍රිස්තු ධර්ම ප්‍රචාරක කටයුතු

වර්ෂ 1658 දී ලන්දේසීන් විසින් දිවයිනෙහි මුහුදුබඩ පෙදෙස් හා යාපනය අර්ධද්වීපය සියතට ගෙන පෘතුගීසීන් පලවා හරිනු ලැබීමෙන් පසු ව මෙරට බල පැවැත්වූ ක්‍රිස්තියානිය වූයේ රෝමානු කතෝලික ධර්මය නො ව රෙපරමාදු කිතුසමය යි. ලන්දේසි පාලනය යටතේ ද ධර්මප්‍රචාරණය හා අධ්‍යාපනය යන උභය කාර්යය ඒකාබද්ධ ව පවත්වා ගෙන යන ලදි. පාසල්වලින් සිදු කෙරුණු ප්‍රධානතම කාර්යය වූයේ අධ්‍යාපනය ලබා දීම නො ව දේශවාසීන් රෙපරමාදු සමයට අනුගත කොට ගැනීම ය.[16] ඒ සඳහා දීපවාසීන් සමඟ දීපභාෂාවෙන් සන්නිවේදන කාර්යයෙහි නිරත වීම අවශ්‍ය වූ බැවින් එබඳු භාෂා අධ්‍යාපනයක් ලබා දීමට සුදුසු තරුණ ලන්දේසි පූජකයෝ ඕලන්දයෙන් ගෙන්වනු ලැබූහ.[17] එමෙන් ම සියලු පූජකයන් දේශභාෂා උගත යුතු යැයි අණක් ද පැනවිණ.[18] අධ්‍යාපනය ලබා දීම හා ධර්මප්‍රචාරණය යන උභය කාර්ය සාධනය පිණිස 1690 දී යාපනයේ හා 1696 දී කොළඹ ද ශාස්ත්‍රාලය පිහිටුවනු ලැබිණ. තදනන්තර ව මෙකී ශාස්ත්‍රාලය ක්‍රිස්තියානි ප්‍රචාරක මධ්‍යස්ථාන බවට පත් විණි.[19]

වර්ෂ 1658 දී දිවයිනට පැමිණි සයිමන් කැට් (Simon Cat = සිමන් කත්)[20] හා යොහැන්නස් රුඑල් (Joannes Ruel)[21] මුල් ම ලන්දේසි ධර්මදූතයන් අතරින් සිංහල භාෂාවෙහි මනා පුහුණුවක් ලද්දා වූ ද සිංහල කියවීම් පොත් සම්පාදනය කළා වූ ද දේවගැතිවරු දෙදෙනෙකි. රුඑල් විසින් සම්පාදිත *Grammatica of Singaleesche Taal- Kunst* සිංහල අකුරු සහිත ව මුද්‍රිත පළමු වන ග්‍රන්ථය සේ සැලකේ. මේ සඳහා ඕලන්දයේ දී සිංහල අකුරු ලීයෙන් කපන ලදි.[22] 1696 ඔක්තෝබර 14 වන දින යොහැන්නස් රුඑල් සිය ප්‍රථම සිංහල දේශනය පැවැත්වී ය.[23] ස්පෙක්ට් එම්. මේසියස්, වැන්ඩර් බෑන්ක් හා මියර්ලන්ඩ් යන දේවගැතිවරු ද ධර්මප්‍රචාරක කටයුතුවල නිරත වූ සිංහල උගත් ලන්දේසි පූජකයෝ ය.[24]

---

14. Peiris, Edmund, (1978), *Studies Historical and Cultural*, Colombo: 75.
15. Fox, W.B., (1936), " A Compendium of Ceylon Portuguese Language", *Ceylon Antiquary and Literary Register*, Vol. 8: 45 - 60, 126- 144; Hettiarachchi, D.E ., (1964), "Influence of Portuguese on the Sinhalese Language", *J.R.A.S. (C.B.)*-(N.S) , Vol. IX: 229-238.
16. Palm, J.D., (1847-48), "An Account of the Dutch Church in Ceylon", *J.R.A.S. (C.B.)*, Vol., No. 3: 5.
17. පීරිස්, පෙර සඳහන් ග්‍රන්ථය: 6.
18. එතන්හි ම.
19. එහි ම.
20. Diehl, Katheriene Smith, (1978), "Simon Cat, Translator 1624 - 1704", *The Ceylon Historical Journal*, Vol.25, Nos. 1-4, October 1978, Dehiwala: 193 ff.
21. පීරිස්, පෙර සඳහන් ග්‍රන්ථය: 7.
22. Ruel, Joannes, (1708), *Grammatica of Singaleesche Taal-Kunst Zynde*, Amsterdam.
23. Palm, (1847 - 48) : 39-40.
24. Ibid: 40-41.

ආගම් ප්‍රචාරය ලන්දේසි ආණ්ඩුවේ වගකීමක් සේ සැලකුණු හෙයින් ලක්වාසීන් ක්‍රිස්තු ලබ්ධි ගැන්වීමේ අරමුණින් ආරබ්ධ පාඨශාලාවන්හි භාවිතය සඳහා ක්‍රිස්තියානියේ මූලිකාංග ඇතුළත් ප්‍රශ්නෝත්තර සංග්‍රහ, ප්‍රථමයෙන් ම පෘතුගීසි භාෂාවට ද අනතුරු ව දෙමළ බසට හා ඉනික්බිති සිංහලයට ද පරිවර්තනය කරන ලදි. සිංහලය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඇති ලන්දේසි ජාතික පරිවර්තකයන් නොමැතිකමෙන් මේ කාර්යය අසාර්ථක විය. සිංහලය මෙන් ම පෘතුගීසි බස ද දන්නා ස්වදේශිකයන් කිහිප දෙනකු ලවා මේ කාර්යය කරවන ලද නමුත් ඇතැම් තන්හි නිරවද්‍ය අර්ථය දැක්වීමට ඔවුන්ගේ පරිවර්තන ශක්‍යතාව ප්‍රමාණවත් නො වූ අතර එම පරිවර්තන අශුද්ධ තත්ත්වයෙන් යුක්ත වූයේ ය. 1696 දී එම කාර්යය සයිමන් කැට් දේවගැතිවරයාගේ අධීක්ෂණය යටතට පැවරීමෙන් අනතුරු ව පාසල්වල භාවිතය සඳහා මෙම ග්‍රන්ථවල සංශෝධිත පිටපත් ලබා ගත හැකි විය. ලන්දේසි පාලනය ධර්ම ප්‍රචාරය සඳහා දේශභාෂා ම යොදා ගත යුතු ය යන ප්‍රතිපත්තියේ පිහිටා කටයුතු කිරීම මේ පරිවර්තන කාර්යය ආරම්භ වීමට මූල හේතුව වූ බව පෙන්වා දිය හැකි ය. වර්ෂ 1700 වන විට කොළඹ දිස්ත්‍රික්කයේ ස්වදේශීය පාඨශාලා හා පූජකස්ථාන 39ක් ද ගාල්ලේ හා මාතර 31ක් ද යාපනය, ත්‍රිකුණාමලය හා මඩකලපුව ප්‍රදේශවල 38ක් ද පිහිටුවනු ලැබ තිබිණි. මේවායෙහි ප්‍රමාණවත් පූජකයන් නො සිටි බැවින් සිංහලයෙන් සභා පැවැත්වීම දුර්වල විය. එහෙත් ධර්ම ග්‍රන්ථ කිහිපයක් සිංහලයට නැඟීමේ කටයුතු සිදු කෙරිණි.[25]

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂ 1711 දී විල්හෙල්ම් කොන්යින් නමැති ලන්දේසි දේවගැතිවරයා මැතිව්, මාක් හා ලූක් ශුභාරංචිවල නව පරිවර්තන ලන්දේසි ආණ්ඩුවට බාර දුන්නේ ය. භාෂා පරිවර්තකයන්ගේ මඟ පෙන්වීමෙන් ඒවා පරීක්ෂාවට භාජන කරන ලදුව සාධුත්වයෙන් පිළිගැනිණි. විල්හෙල්ම් කොන්යින් සිංහල බයිබල පරිවර්තනයේ පුරෝගාමියා සේ සැලකේ. පසු කල හෙතෙම "තත්කාලීන ශ්‍රේෂ්ඨතම සිංහල පඬිවරයා" යනුවෙන් වෙසෙසනු ලැබී ය.[26] සයිමන් කැට් හා විල්හෙල්ම් කොන්යින් විසින් සම්පාදිත ග්‍රන්ථ 18 වන සියවසේ මැද භාගයේ දී විල්හෙල්මුස් වෙට්සෙලියුස්, යෝකිම් ෆිබ්‍රන්ඩ්ස්, හා හෙන්රිකස් පිලිප්ස් විසින් සංශෝධිත ව ලන්දේසි ආණ්ඩුව විසින් මුද්‍රණය කරවන ලදි.

සිංහල මුද්‍රණ ශිල්පයට පදනම දැමුණේ මේ පසුබිමෙහි ය. ධර්මප්‍රචාරණය හා අධ්‍යාපනය යන උභය කාර්යය සඳහා ලන්දේසි ආණ්ඩුව විසින් මෙරට පාඨශාලා ආරම්භ කරන ලද බව ඉහත සඳහන් කෙරිණි. මෙරට විසූ යුරෝපීයයන්ට පෘතුගීසි හා ලන්දේසි දෙබසින් අධ්‍යාපනය ලබා දුන් අතර ස්වදේශීන් සඳහා වූ පාඨශාලාවන්හි භාෂා මාධ්‍ය වූයේ සිංහලය හා දෙමළය යි. මේ පාසල්වල ලිවීමේ හා කියවීමේ මූලිකාංග ද සහිත ව කතිකීස්ම හා යාච්ඤා ද උගන්වන ලදි.[27] දේවධර්මය, ග්‍රීක්, ලතින් හා ඕලන්ද භාෂා හැර සිංහල හා දෙමළ ඉගැන්වීමට විශේෂ ආචාර්යවරු පත් කරනු ලැබූහ.[28] එසේ ද වුව, දේශීය පාසල් ගුරුවරුන්, කතිකීස්ම ගුරුවරුන් හා ප්‍රොපොනන්ට්වරුන් ද ඔවුන් යටතේ වූ ශිෂ්‍යයන් ද අතර දැනුම් පරතරය ඉතා අල්ප වූ බව පැවසේ.[29] යෝග්‍ය ඉගැන්වීමේ උපකරණවල

25. Palm (1847-48): 33, 47.
26. Ibid: 57.
27. පීරිස්, පෙර සඳහන් ග්‍රන්ථය : 6.
28. එහි ම.
29. එම.

හිඟකම මේ තත්ත්වය උද්ගත වීමෙහි එක ම හේතුව සේ දැක්විය නො හේ. ඉහත කී දෙපිරිස අතර නිසි පුහුණුවක් ලද්දවුන් නො සිටීම ද ප්‍රබල හේතුවක් වී ය. ඉගැන්වීමේ උපකරණවල හිඟය ලන්දේසි පාසල් සම්බන්ධයෙන් ද බල පැවැත්වූවකි. මූලික ලන්දේසි කියවීම් පොත්, කතිකීස්ම හා ලිපිද්‍රව්‍ය යනාදියෙහි හිඟකම යටත්විජිතයේ ලන්දේසි දරුවන්ගේ අධ්‍යාපනය අඩාළ වීමට හේතු වන බැවින් ඒවා නිසි පරිදි සපයන ලෙස වරින් වර ඉල්ලීම් කෙරිණි.[30] සිංහල හා දෙමළ ඉගැන්වීමේ උපකරණවල තත්ත්වය ලන්දේසි ඉගැන්වීමේ උපකරණවල තත්ත්වයට ද වඩා නරක වූයේ ය. ලන්දේසි පොත් මුද්‍රිත ඒවා වූ අතර මුද්‍රිත සිංහල පොතපත නො වූ බැවින් භාවිතයට ගැනුණු සිංහල ඉගැන්වීමේ ද්‍රව්‍ය වූයේ ප්‍රමාණයෙන් විශාල වූ ද පහසුවෙන් හැසිරවිය නො හැකි හා පහසුවෙන් ප්‍රකෘතිමත් කළ නො හැකි වූ ද අත්පිටපත් ය. එම අත්පිටපත් එක ම ආකාරයේ කොළවල ලියන ලද ඒවා නො වූ බව ද පෙනේ. මුනම්පිට්ටි මලබාර් පාසලේ භාවිත වූ මැතිව් ශුභාරංචිය ලියා තිබූ පුස්කොළ පරණ වී ගොස් ඇති බැවින් ඒවා අලුතින් කඩදාසිවල ලියා දෙන මෙන් එම පාසලේ ගුරුවරයා විසින් කරන ලද ඉල්ලීමක් ගැන වාර්තා වෙයි.[31] මේ වාර්තාව දෙමළ අත්පිටපතක් ගැන වුව ද සිංහල පාසල්වල ඉගැන්වීම් ද්‍රව්‍ය සම්බන්ධයෙන් ද මේ තත්ත්වය ම පවතින්නට ඇතැයි ගැනීම සහේතුක ය. එසේ ද වුව, කඩදාසි සුලබ නො වීම හේතුවෙන් මෙබඳු ඉල්ලීම් පහසුවෙන් ඉටු කළ නො හැකි විය. "ලිපි ද්‍රව්‍ය එක්කෝ කිසි සේත් ම නො තිබිණි; නැත හොත් මසුරු ලෙස බෙදා හැරිය යුතු වූයේ ය. ගාලු දිස්ත්‍රික්කයේ ළමයින් අකුරු ලිවීම සඳහා වැලිපිල්ල භාවිත කරන බව කියනු ලැබේ" යැයි මේ සම්බන්ධයෙන් යටත්විජිත බලධාරීන්ට කරුණු දැක්වූ ඩී. ජේ. පාම් දේවගැතිවරයාගේ වචන යි.[32] මේ තත්ත්වය යටතේ පාඩම් පොතක අත්පිටපතක් හෝ සපයා ගත හැකි වූයේ ගුරුවරයාට පමණක් වූ අතර ඒ නිසා ම කටපාඩම් කිරීම එක ම ඉගැන්වීම් ක්‍රමය බවට පත් විය.[33]

ඉහතින් නම් සඳහන් කෙරුණු සයිමන් කැට්, යොහැන්නස් රුඑල්, ජේ.පී. වෙට්සෙලියුස්, විල්හෙල්ම් කොන්යින් මෙන් ම ඔවුන්ගේ පශ්චාත්කාලීනයන් වන ජේ. ජේ. ෆිබ්‍රන්ඩ්ස් හා හෙන්රිකස් පිලිප්ස් ද සිය පරිවර්තන හා ග්‍රන්ථ සම්පාදන කාර්යය අරඹනුයේ මේ පසුබිමෙහි ය. 1600 - 1725 අතරතුර, මුළුමනින් ම ආගමික ස්වරූපයෙන් යුක්ත වූ ද දේශීය ආගමික ස්ථානයන්හි හා පාඨශාලාවන්හි භාවිතය සඳහා අත්‍යවශ්‍ය වූ ද ලේඛන රාශියක් ලන්දේසි භාෂාවෙන් සිංහලයට පරිවර්තනය කරනු ලැබ තිබිණි. ඒවා පැවතියේ පුස්කොළවල හෝ කඩදාසිවල හෝ ලියන ලද අත්පිටපත් වසයෙනි. 1703 වන විට මෙරට සිටි ප්‍රොපොනන්ට්වරු ද කැතිකිස්ට්වරු ද පාසල් ගුරුවරු ද සියල්ලෝ ම ස්වදේශිකයෝ වූහ. පාසල් ශිෂ්‍ය සංඛ්‍යාව 70000ක් විණැයි ද මේ වර්ධනයට හේතු වූයේ පාසල් නො යන්නවුන්ට දඩ ගසන බවට පැවති රාජාඥාව බව ද කියවේ. පාසල් සඳහා රජයෙන් සැපයුණු මූල්‍ය හා පරිපාලන අනුග්‍රහය ද අනල්ප වූ අතර සෑම දේවස්ථානයක් හා සම්බන්ධ පාසල බැගින් ද වූයේ ය. පෘතුගීසීන් විසින් හඳුන්වා

30. පීරිස්, පෙර සඳහන් ග්‍රන්ථය: 6
31. Palm, (1847 - 48): 16.
32. මෙබඳු ලිපියක් පාම් ඉහත නිබන්ධනයේ 5 පිටෙහි උපුටා දක්වයි.
33. Palm, J.D., (1846 - 47), "The Education Establishment of Dutch in Ceylon" , *J.R.A. S. (C.B.)*, Vol. I, No.2: 124.

දෙන ලද අධ්‍යාපන ක්‍රමය ලන්දේසීන් විසින් මෙසේ වර්ධනය කොට පවත්වා ගෙන ඒමේ මූලික අරමුණ ආගම ප්‍රචාරය කිරීම බව පැහැදිලි ය.[34]

වර්ෂ 1735 වන විට මෙරට ප්‍රබල ක්‍රිස්තියානි ධර්මදූත ව්‍යාපාරයක් සඳහා සියලු කටයුතු සම්පාදිත ව තිබූ අතර එහි ලා උපස්තම්භක කොට ගත හැකි පොතපත සුලබ කිරීමේ තාක්ෂණයක් හඳුන්වා දීම කෙරෙහි ලන්දේසි ආණ්ඩුවේ අවධානය යොමු වී තිබිණි. මුද්‍රණාලයක් පිහිටුවීමෙන් සත්‍යදෘෂ්ටි ප්‍රචාරණයට බාධක වන සියලු සාධක ඉවත් කර ගත හැකි ය යන්න ලන්දේසි ධර්මදූතයන්ගේ අදහස විය. ගුස්තාව් විල්හෙල්මුස් බරන් වොන් ඉම්හොෆ් ආණ්ඩුකාරයා ද බෞද්ධ හා ඉස්ලාමීය ජනයා වෙත ක්‍රිස්තියානිය පැතිරවිය යුතු බව වටහා ගෙන ක්‍රියා කළ අයකු බව කියනු ලැබේ. ඔහුට පූර්වයෙහි සිටි ජාකොබ් ක්‍රිස්තියන් පිලත් ආණ්ඩුකාරයා ඒ සඳහා දැමූ පදනම ඔහුට වැදගත් වූ අතර එහි ලා මඟ පෙන්වීම පිණිස ජේ. පී. වෙට්සෙලියුස්, විල්හෙල්ම් කොන්යින් දේවගැතිවරු දෙදෙන ද ලන්දේසි ආණ්ඩුවේ ආයුධ ගබඩාවේ වැඩ පරීක්ෂක ගාබ්රියෙල් ස්කාද ද ඉදිරිපත් වී සිටියහ.[35] වර්ෂ 1736 දී ලන්දේසි ආණ්ඩුව විසින් මුද්‍රණාලයක් ආනයනය කරන ලදී.[36] ලක්දිව මුද්‍රිත ප්‍රථම සිංහල පොත ලෙස සැලකෙන *SINGALEESCH GEBEEDE - BOEK* වර්ෂ 1737 දී එළි දැක්විණි. එතැන් සිට ලක්දිව ලන්දේසි පාලනය අවසන් වීමෙන් වසර දෙකක් ගත වන තෙක් එම මුද්‍රණාලයෙන් පළ කෙරුණු ග්‍රන්ථ සංඛ්‍යාව (පුනර්මුද්‍රණ ද ඇතුළු ව) 28ක් බව මේ සම්බන්ධ අධ්‍යයනයන්හි නිරත වූ සරත්චන්ද්‍ර වික්‍රමසූරිය විසින් පෙන්වා දී ඇත.[37] ලංකාවේ මුද්‍රිත පොත් හා පත්‍රිකා පිළිබඳ ග්‍රන්ථයක් පළ කළ ජෝන් මර්ඩොක් හා ජේම්ස් නිකොල්සන් (1868) දෙපලට අනුව එම සංඛ්‍යාව 22කි.[38] වර්ෂ 1845 දී පී. ජේ. ඔන්ඩච්චි පළ කළ ලිපියකින් පෙන්වා දී ඇති පරිදි 1737 සිට 1790 තෙක් එම මුද්‍රණාලයෙහි මුද්‍රණය කෙරුණු ග්‍රන්ථ සංඛ්‍යාව ග්‍රන්ථ නාම 52කි. ඉන් 26ක් සිංහලයෙන් ද (පුනර්මුද්‍රණ ද ඇතුළු ව), 19ක් දෙමළයෙන් ද ඕලන්ද බසින් තුනක් හා පෘතුගීසි හා ලතින් භාෂාවලින් දෙක බැගින් ද මුද්‍රිත බව පෙන්වා දෙනු ලැබේ.[39]

---

34. ජේ. ඩී. පාම්, එච්. ඒ. වින්ඩ්හැම් හා එස්. අරසරත්නම් ඇසුරෙන් සරත්චන්ද්‍ර වික්‍රමසූරිය මේ කරුණු දීර්ඝ වසයෙන් සාකච්ඡා කරයි. Wickramasuriya, Sarathchandra, (1978), "The Begining of the Sinhalese Printing Press", *Senarat Paranavitana Commemoration Volume*, ed. P.L Prematilake, K. Indrapala, J. E. Van Lohuizen - De Leeuw, Leiden, E.J. Brill: 286.
35. පීරිස්, පෙර සඳහන් ග්‍රන්ථය: 9.
36 ලංකාවේ ප්‍රථම මුද්‍රණාලය පිහිටුවනු ලැබූ වර්ෂය තව මත් අවිනිශ්චිත ය. ලක්දිව ප්‍රථම සිංහල ග්‍රන්ථයෙහි මුද්‍රිත වර්ෂය වන 1737 දී ම මුද්‍රණාලය පිහිටුවනු ලැබිණැයි සරත්චන්ද්‍ර වික්‍රමසූරිය අදහස් කරයි (Wickramasuriya, (1978): 283, 288). ජේ. ඩී. පාම් පියතුමා දක්වා ඇත්තේ එය 1736 දී පිහිටුවනු ලැබූ බව යි (Palm, (1846 - 47 ): 125). එම්. ඩබ්ලිව්. ජුරියන්ස් පවසන්නේ එය 1734 දී පිහිටුවනු ලැබූ බව යි (Jurriaanse, M.W.,(1943), *Catalogue of the Archives of Dutch Central Government of Coastal Ceylon 1640 -1796*, Colombo: 19). වර්ෂ 1729 දී ගාබ්රියෙල් ද ස්කාද විසින් මුද්‍රණාලයේ කටයුතු අරඹන ලද බව එඩ්මන්ඩ් පීරිස් පියතුමාගේ අදහස යි. (පීරිස්, පෙර සඳහන් ග්‍රන්ථය: 10.) 1736 මුද්‍රණාලය ආනයනය කෙරුණු වර්ෂය බව ඩග්ලස් සී. මැක්මර්ට්රිගේ මතය යි (Mc Murtrie, Douglas C., (1931), *Memorandum of the First Printing Press in Ceylon*, Chicago:5).
37. Wickramasuriya, (1978): 290-94.
38. Murdoch, John and James Nicholsan, (1868), *Classified Catalogue of Printed Tracts and Books in Ceylon*, Madura: 3-4.
39. Ondaatje, P. J., "A Tabular List of Original Works and Translations Published by the Late Dutch Government of Ceylon at their Printing Press at Colombo", *JRAS (GB & I)*, N. S. No. 1, 1865: 141 - 144.

බයිබලයේ හෙවත් ක්‍රිස්තියානි ආගමේ ශුද්ධග්‍රන්ථයේ සිංහල මුද්‍රණයක් බිහි වනුයේ යට දැක්වූ පසුබිමෙහි ය. එය 1668 සිට 1780 තෙක් සිදු වූ ක්‍රියාදාමයක ප්‍රතිඵලයක් බව පෙන්වා දිය හැකි ය. එහි පළමු පියවර වූයේ, විල්හල්ම් කොන්යින් විසින් ග්‍රීක භාෂාවෙන් සිංහලයට පරිවර්තිත, ජේ. පී. වෙට්සෙලියුස් විසින් සංශෝධිත, 1739 දී මුද්‍රණද්වාරයෙන් එළි දුටු "අපගේ නායකවූ ගැලවුම්කාර/ යෙසූස් ක්‍රීස්තුස් වහන්සේගේ/ සුධවූ එවුඅන්ජෙලිය/(මතෙවුස් මකීකුස් ඇකස් යොහනෙනස්/ යන දෙවියනවහන්සෙගෙන් එවාවදාරනඩ යෙදුනු අයවල් නැමැති සුධවූ/ එවුඅන්ජෙලිස්තවරුන්ගෙන් ලියවුනු හැටියැ)" යන පොත යි ; මෙය යොහාන් යොආබිම් එයිබ්‍රින්ස හා හෙන්රිකුස් වීලෙප්ස විසින් තව දුරටත් සංශෝධිත ව වර්ෂ 1780 දී නැවත මුද්‍රණය කෙරිණි.[40]

වර්ෂ 1770 - 1780 අතර වකවානුවේ දී අලුත් තෙස්තමේන්තුව කොටස් සයකින් යුක්ත ව ප්‍රකාශයට පත් කෙරිණි.[41]

1. ඉහත සඳහන් කෙරුණු ශුභාරංචි සතර.
2. සුධවූ අපොස්තුළු පවුළුස් රොමානුස්වරුන්ඩ ලිවූ යැවුන්පත්‍රයැ, 1770, (1-40 පි.)
3. එවුඅන්ගේලිස්ත ඇකස් විසින් ලියවුනු අපොස්තුළුවරුනෙන ක්‍රියාවල් යන පොතයැ, 1771, (1-88 පි.)
4. සුධවූ අපොස්තුළු පවුළුස් කොරින්තුස්වරුන්ඩ ලිවූ යැවුන්පත්‍ර දෙකද ග්ලාතවරුන්ඩ ලිවූ යැවුන්පත්‍රයැ, 1773, (1-76 පි.)
5. සුධවූ අපොස්තුළු පවුළුස් එෆෙස්වරුන්ඩ පිලිප්පැන්‍ෂවරුන්ඩ කොලොස්සැන්‍ෂවරුන්ඩ තැස්සලොනිසැන්‍ෂවරුන්ඩ සහ තිමොතෙඔස්හට තීතුස්සට පිලොමොන්හටද හෙබ්‍රෙවුවරුන්ඩද ලිවූ යැවුන්පත්‍රවල්, 1776, (1-102 පි.)
6. සුධවූ අපොස්තුළුවරුන්ගෙ පොදුවූ යැවුන්පත්‍රවල් එනම් යකොබුස්ගෙ එකයි පෙතෘස්ගෙ දෙකයි යොහන්නැස්ගෙ තුනයි යූදස්ගෙ එකයි යොහැන්නැස්ගෙ එළිදරවුකෙරීමයි, 1776, (1-88 පි.)

මේ සියලු ම පරිවර්තන තදීය ග්‍රීක පරිවර්තන හා සසඳා සංශෝධිත හෝ බයිබලයේ ග්‍රීක පරිවර්තනයන්ගෙන් සිංහලයට නඟන ලද හෝ බවත් ඒවා සිංහලයට නැඟීම සඳහා විල්හෙල්ම් කොන්යින්, යොහාන් ෆිබ්‍රන්ඩ්ස්, හෙන්රිකස් පිලිප්ස් හා සයිමන් කැට්ගේ අධීක්ෂණය යටතේ "සීහල බාසාකාර දෙදෙනෙක්" දායක වී ඇති අතර අන්‍යයන් විසින් කෙරුණු පරිවර්තන යොහාන් ෆිබ්‍රන්ඩ්ස්, හෙන්රිකස් පිලිප්ස් දෙපල විසින් සංශෝධිත බවත් දැක්වේ.

---

40. මෙහි ප්‍රථම මුද්‍රණය අෂ්ටපත්‍ර (Octavo) ප්‍රමාණයෙන් මුද්‍රිත බව සරත්චන්ද්‍ර වික්‍රමසූරිය හා ඩග්ලස් සී. මැක්මර්ට්රි පවසතත් මර්ඩොක් හා නිකොල්සන් දක්වා ඇත්තේ එය චාතුර්පත්‍ර (Quarter) ප්‍රමාණයෙන් මුද්‍රිත බව යි. මෙහි පිටපතක් or 71 d 12 අංකය යටතේ බ්‍රිතාන්‍ය පුස්තකාලයේ පෙරදිග කියවීම් ශාලාවේ තැන්පත් කොට ඇත. එය චාතුර්පත්‍ර ප්‍රමාණයේ මුද්‍රාඞ්කණයක් වන අතර කොළඹ ජාතික කෞතුකාගාර පුස්තකාලයෙහි (ජා.කෞ.පු. 15 I 4) ඇති මෙහි දෙවන මුද්‍රණය (1780) ද චාතුර්පත්‍ර ප්‍රමාණයේ මුද්‍රාඞ්කණයක් වේ.
41. ජා. කෞ. පු. 15 I 4.

මෙම ශුද්ධග්‍රන්ථ පරිවර්තනවලට අමතර ව හයිඩ්ල්බර්ග් කතිකිස්මය (පරි: විල්හෙල්ම් කොන්යින්), *A Confession of Faith/ Sinhala Confession of Faith* (පරි: ජේ. පී වෙට්සෙලියුස්), **සිංහල පල්ලික්කුඩම්වල පොතය** (කර්තෘ/පරිවර්තක අඥාත යි.), *A Short Statement of the Doctrine of the Truth*, Translated into the Singhalese Language (පරි: ජේ.පී. වෙට්සෙලියුස්), සිංහල දේවමෙහෙය පුස්තකය (කර්තෘ/පරිවර්තක අඥාතයි.), *Four Sermon* (පරි: විල්හෙල්ම් කොන්යින්), සිංහල බාසාවෙන් ගීතිකා පොත (ඇන්තනි පෙරේරා හා ලූයි ද සරම්), පසල්මුවල් සහ ඉස්තුති ගීතිකා (පරි: හෙන්රිකුස් පිලිප්ස්), සාන්ත පාවුලුගේ සුබාරංචිය ආදී ආගමික ග්‍රන්ථ කිහිපයක් ද සිංහල භාෂාව පිළිබඳ ව්‍යාකරණ ග්‍රන්ථයක් (සම්පාදක හෙන්රිකුස් පිලිප්ස්) හා සිංහල ශබ්දකෝෂයක් (කර්තෘ/පරිවර්තක අඥාත යි.) ද පිළිබඳ තොරතුරු අපට හමු වේ.[42]

ලන්දේසි යුගයේ බයිබල් පරිවර්තකයන් හා ආගමික ග්‍රන්ථ සම්පාදකයන් ද ග්‍රන්ථ ශෝධකයන් ද අතරින් ප්‍රමුඛයන් වන සයිමන් කැට්, යොහැන්නස් රුඑල්, ජේ. පී. වෙට්සෙලියුස් හා විල්හෙල්ම් කොන්යින් ධර්මදූත කාර්යය සඳහා පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම මඟින් මෙරටට ගෙන්වන ලද විදේශිකයෝ වූහ. ඔවුන්ගේ පශ්චාත්කාලීනයන් වන ජේ. ජේ. ෆිබ්රන්ඩ්ස් (1724-1801) ලක්දිව උපන් ප්‍රථම ලන්දේසි පරම්පරාවට අයත් වූවෙකි. ඔහු ලේඩින් සරසවියෙන් ශාස්ත්‍රෝද්ග්‍රහණය කොට පෙරළා පැමිණ ධර්මදූත සේවයෙහි හා ග්‍රන්ථකරණයෙහි නිරත වූයේ ය. ෆිබ්රන්ඩ්ස් ලන්දේසි, සිංහල හා මැලේ භාෂාවන්හි හසළ දැනුමැත්තකු සේ පිළිගැනේ.[43] හෙන්රිකස් පිලිප්ස් (1733 - 1790) සිංහලයෙකි. ඔහුගේ සම්පූර්ණ නම හෙන්රික්ස් පිලිප්ස් පණ්ඩිතරත්න යි. වන් ගොලන්ස් ආණ්ඩුකාරයාගේ මහමුදලි තනතුර හෙබවූ ලියනගේ පිලිප්ස් පණ්ඩිතරත්න ඔහුගේ පියා ය.[44] කොළඹ දී ජන්මලාභය කළ ඔහු කොළඹ සෙමනේරියෙන් මූලික අධ්‍යාපනය ලබා ඕලන්දයේ උට්රෙච්ට් කරා ගොස් වැඩි දුර අධ්‍යාපනය ලැබූ අතර කලක් කොළඹ සෙමනේරියේ අධිපති ධූරය ද ඇරී ය.[45]

## ලක්දිව බ්‍රිතාන්‍ය පාලන සමයේ ක්‍රිස්තු ධර්ම ප්‍රචාරක කටයුතු

1. බයිබල් සමාගම

වර්ෂ 1796 සිට 1948 දක්වා පැවති බ්‍රිතාන්‍ය පාලන යුගයේ දී ද මෙරට ක්‍රිස්තු ධර්මය ප්‍රචාරය කෙරිණි. 1812 දී දිවයිනේ බයිබල පරිවර්තනය හා බෙදාහැරීම සඳහා කොළඹ බයිබල් සමාගම (Colombo Auxiliary Bible Society) පිහිටුවීම සිංහල සාහිත්‍යයේ නූතන යුගයේ සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැකි ය. එම සමාගමයේ ප්‍රථම රැස්වීමේ වාර්තා අනුව 1. අවංක ලබ්ධිකයන්ට ඔවුන්ගේ තරාතිරම අනුව යුතුකම් පිළිබඳ උපදෙස් දීමත්, 2. නාමික ක්‍රිස්තියානීන් ශුභාරංචියේ සත්‍ය

42. Wickramasuriya, (1978); Murdoch and Nicholsan (1868); Mc Murtrie (1931) යන ලේඛනවල මේ පිළිබඳ විස්තර දැක්වේ
43 Diehl, Katharine Smith, (1976), "Ceylon Students Abroad in Eighteeenth Century", *Historical Essays*, Colombo: 18 - 19.
44. Vander Wall, E.H.,(n.d.), *The Contribution of the Dutch to the making of Ceylon*, Reprinted from *The Journal of the Dutch Burgher Union* for 1932, Colombo: 5.
45. Diehl, (1976): 23-24.

අනුගාමිකයන් බවට පත් කිරීමත්, 3. දේවරූප වන්දනා කරන්නවුන්ගෙන් මුළා වූ ජනතාව බේරා ගැනීමත් එහි අරමුණු වූ බව පෙනේ.[46] ධර්මඥානය නොමිලයේ බෙදා දීමට මොවුන් උත්සාහ ගත් බව යටත්විජිත යුගයේ වාර්තාවලින් පෙනී යයි.

19 වන සියවසේ දිවයිනේ ප්‍රධාන භාෂා වූයේ සිංහල, දෙමළ හා පෘතුගීසි භාෂා යි. දෙමළ බයිබල පරිවර්තන දකුණු ඉන්දියාවෙන් ද පෘතුගීසි පරිවර්තන ලන්ඩනයෙන් ද සපයා ගත හැකි වූ අතර ලන්දේසි යුගයේ (1780) මුද්‍රිත සිංහල බයිබලය මේ අවධිය වන විට සපයා ගැනීම දුෂ්කර ව පැවතිණි. එහෙයින් එම පරිවර්තනය නැවත මුද්‍රණය හදිසි අවශ්‍යතාවක් බව බයිබල සමාගමයේ තීරණය විය.[47] මේ බයිබල පරිවර්තනයේ නව මුද්‍රණයක් වර්ෂ 1813 දී ඩිමයි 1/8 ප්‍රමාණයේ පිටු 1183ක් හා මුල් පිටු 2ක් ද සහිත ව ශ්‍රී රාමපුර මුද්‍රණාලය මඟින් නැවත එළි දක්වන ලදි.[48] මුල් මුද්‍රණයේ වූ අඩුපාඩු මෙහි ද දැකිය හැකි වූයේ මේ කාර්යයෙහි ලා පිටපත් සංස්කරණ කාර්යයක් හෝ මුද්‍රණ අධීක්ෂණයක් හෝ සිදු නො වූ බැවිනි. මෙය භාෂාමය හා මුද්‍රණ දෝෂවලින් මතු නො ව අර්ථමය දෝෂවලින් (Factual Errors) ද ගහන විය. පුද්ගල නාමවල සාවද්‍ය උච්චාරණ මෙන් ම විසමරූපීබව ද දක්නට ලැබුණු අතර අනවශ්‍ය, අර්ථවිරහිත යෙදුම්වලින් ද යුක්ත විය. සෑම වාක්‍යයක් ම පාහේ "තවද" යන්නෙන් ආරම්භ කොට තිබිණි. එය 1780 මුද්‍රණයේ නො වූවකි. ගද්‍ය (ලේඛන) ව්‍යවහාරයෙහි ලා කිසි සේත් භාවිත නො වන, භාෂණ ව්‍යවහාරයෙහි පවා දැකිය නො හැකි අව්‍යක්ත යෙදුම් පවා මෙහි දක්නට ලැබිණි. නව තෙස්තමේන්තුවේ සයිමන් කැට්, විල්හෙල්ම් කොන්යින් හා හෙන්රිකස් පිලිප්ස් තිදෙනාගේ පරිවර්තනවලට ඇතුළත් වූ ඇතැම් කොටස් ඒවා පළමු වර මුද්‍රණය කිරීමට ද සිය වසකට පමණ පෙර සිංහලයට නැඟුණු අතර ඒවාහි බස් වහර වූයේ තත්කාලීන භාෂණ ව්‍යවහාරය යි. එසේ ද වුව මේ බයිබල පරිවර්තනය සිංහල ක්‍රිස්තියානි සාහිත්‍යයේ කඩඉමක් සේ සැලකේ.[49]

මේ තත්ත්වය සමකාලීන ක්‍රිස්තියානි ධර්මදූතයන්ගේ කනස්සල්ලට හේතු වූ බව පෙනේ. බයිබල් සමාගම නව බයිබල පරිවර්තනයක නිරත ව සිටි අතර ඔවුන්ට සිය මුද්‍රණ අවශ්‍යතා දේශීය වසයෙන් සපුරා ගැනීම සඳහා ලන්දේසි මුද්‍රණාලය ප්‍රතිසංස්කරණය කර ගැනීමට සිදු විය. (වර්ෂ 1786 දී ඉංගිරිසී විසින් ලන්දේසීන් සතු ව පැවති දිවයිනේ මුහුදු බඩ පෙදෙස් අල්ලා ගැනීමේ දී ලන්දේසීන් විසින් ඇරඹුණු මුද්‍රණාලයය ද අත්පත් කොට ගැනිණි.) අලුතින් පැමිණි වෙස්ලියානු ධර්මදූතයන් 1815 දී අභිනව මුද්‍රණාලයක් ඇරඹීම බයිබල සමාගමයට මහත් පහසුවක් විය. පුහුණු මුද්‍රණකරුවකු වූ විලියම් හාවඩ් වෙස්ලියානු ධර්මදූතයන් අතර සිටි බැවින් බයිබල් සමාගමයේ කටයුතු විශ්වාසයක් මත ඔවුන්ට පැවරිණි.[50]

---

46. *The First Report of the Colombo Auxiliary Bible Society,* 1813, Colombo. (මූලය: Somaratna, G. P. V., (1991), "The History of Sinhala Bible", *J. R. A. S.* (Sri Lanka Branch.), Vol. XXXIV, (N. S.) 1989/90: 46.)
47. *The Third Report of the Colombo Auxiliary Bible Society,* 1815, as quoted by Somaratna, (1991): 47.
48. ජා. කෞ. පු. 15 I 11.
49. Weerasinghe, S. J. de S., (1952), "The Sinhala Bible from Early Beginings to Our Times", *New Lanka,* O. A. B. No. 3: 69-79.
50. Somaratna, (1991): 47.

බ්‍රිතාන්‍ය යුගයේ මුල් ම බයිබල් පරිවර්තකයා වූයේ විලියම් ටොල්ෆ්‍රි ය. "ඇත්ත වසයෙන් ම, ඔහු බයිබලයේ නව පරිවර්තනයක් මේ දිවයිනේ වාසීන්ට ප්‍රදානය කිරීමේ ප්‍රයත්නයේ පුරෝගාමියා ය. ඔහු මේ අභිප්‍රාය මුදුන්පත් කර ගැනීම සඳහා වසර හතරහමාරක කාලයක් අප්‍රමාදී ව දෘඪෝත්සාහයක් දැරුවේ ය."[51] මේ සඳහා ටොල්ෆ්‍රි ලංකාවේ පදිංචිය ආරම්භ කළ දා පටන් ම දිවයිනේ භාෂා හැදෑරීම ඇරඹී ය. ඔහු වෙනත් යුරෝපීයයකුට වඩා හොඳින් සිංහල හා පාලි උගත්තේ ය. නව ගිවිසුමේ සංස්කෘත හා බෙංගාලි පරිවර්තන සම්බන්ධයෙන් ඔහු සතු වූ දැනුම එහි ම ඉංගිරිසි හා ග්‍රීක පරිවර්තන සම්බන්ධයෙන් ඔහු සතු වූ දැනුම හා සම කළ හැකි යැයි පැවසේ.[52]

විලියම් ටොල්ෆ්‍රි 1817 ජනවාරි 03 වන දින අභාවප්‍රාප්ත වූයේ ය. ඔහුගේ අවසාන කෘත්‍යය සඳහා ආණ්ඩුකාරයා ද ආණ්ඩුවේ හා හමුදාවේ උසස් නිලධාරීන් ද සහභාගි වූ බව කොළඹ බයිබල් සමාගමයේ වාර්තාව පවසනුයේ එම සහභාගිත්වය ටොල්ෆ්‍රි විසින් ශුද්ධ ග්‍රන්ථ පරිවර්තනයෙන් කරන ලද සේවය අගය කිරීමක් බව පෙන්වීමට යැයි කිව හැකි ය.[53]

ටොල්ෆ්‍රිගේ නව තෙස්තමේන්තු සිංහලානුවාදය වර්ෂ 1817 දී නිකුත් විය.[54] මේ කාර්යයේ දී ටොල්ෆ්‍රිට පිටකොටුවේ සාන්ත පාවුලුගේ දේවස්ථානයේ ජ්. ආර්මර්, බැප්ටිස්ට් ධර්මදූතායතනයේ ජේම්ස් චේටර් හා වෙස්ලියන් ධර්මදූතායතනයේ බෙන්ජමින් ක්ලෆ් යන දේවගැතිවරුන්ගේ සහාය ලැබිණි.[55] සම්පූර්ණ බයිබල පරිවර්තනය අවසන් කිරීමට පෙර ටොල්ෆ්‍රි මිය ගියෙන් ඒ සඳහා පරිවර්තක මණ්ඩලයක් පත් කරනු ලැබූහ. ඉහත නම් සඳහන් දේවගැතිවරුන්ට අමතර ව ආණ්ඩුවේ වාසලමුදලි දොන් ආබ්‍රහම් ද තෝමස්, ප්‍රොපොනන්ට්වරයකු වූ පී. පණ්ඩිතසේකර හා මුදලි ජෝර්ජ් නදෝරිස් ද සිල්වා යන තිදෙන ඊට ඇතුළත් වූවෝ ය.[56] පී. පණ්ඩිතසේකර, කරතොට ධම්මාරාම හිමියන්ගේ ශිෂ්‍ය භික්ෂුවක වූ අක්මීමන උන්නාන්සේ උපැවිදි ව පෙනී සිටි නාමය යි. හෙතෙම ක්‍රිස්තුලබ්ධිය වැලඳ ගත්තේ ප්‍රොපොනන්ට්වරයකු ව තද් ලබ්ධි ප්‍රචාරණයෙහි නිරත වූයේ ය.[57] 1817 අවසානයේ දී ලංකා සිවිල් සේවාවේ සී.ඊ. ලෙයාර්ඩ් හා පී. පෙරේරා මුදලිවරයා ද ඊට එක් කර ගනු ලැබූහ.[58] ලෙයාර්ඩ්ගේ ඉවත් වීමෙන් පසු ව වෙස්ලියානු ධර්මදූතායතනයේ දේවගැතිවරයකු වූ ඩබ්ලිව්. බී. ෆොක්ස් පරිවර්තක මණ්ඩලයට බඳවා ගන්නා ලදි.[59] 1822 දී බෙන්ජමින් ක්ලෆ් දිවයින හැර ගියෙන් වෙස්ලියානු ධර්මදූතායතනයේ ම අයකු වූ ඩී. ජේ ගොගර්ලි ඊට සම්බන්ධ වූ බව පැවසේ. මේ කමිටුවේ පරිශ්‍රමය හේතුවෙන් 1823 දී සම්පූර්ණ බයිබලය කාණ්ඩ තුනකින් යුක්ත ව එළි දැක්විය හැකි වූ බව බයිබල

51. *The Fifth Report of the Colombo Auxiliary Bible Society,* 1817, MDCCXVII, Colombo, Wesleyan Mission Press: 12.
52. Ibid:14.
53. Ibid.
54. ජා. කෞ. පු. 15 I 10.
55. Sarathchandra, E. R., (1950), *The Sinhalese Novel*, Colombo: 74.
56. Ibid: 76.
57. Tillekaratne, John F., (1889), "The Life of Karatota Sri Dhammarama, High Friest of Matara in the Southern Province of the Islalnd of Ceylon", *The Orientalist,* Ed. William Goonetilleke, Vol. III: 206.
58. Weerasinghe, (1952): 73-74.
59. Ibid.

සංගමයේ වාර්තාවක් උපුටා දක්වමින් ජී. පී. වී. සෝමරත්න පවසයි.[60] ලක්දිව මුද්‍රණ ශිල්පය ව්‍යාප්ත වූ වූ මුල් කාලයේ පොතපත පිළිබඳ ග්‍රන්ථ නාමාවලියක් පළ කළ ජෝන් මර්ඩොක් හා ජේම්ස් නිකොල්සන් ද පවසනුයේ පරණ තෙස්තමේන්තු සිංහල පරිවර්තනය 1823 දී සම්පූර්ණ කරන ලද බව යි.[61] මෙකරුණ සනාථ කිරීම සඳහා ඔවුහු 1865 දී ප්‍රකාශිත වාර්තාවක් ද ඇසුරු කරති.

එසේ ද වුව, වර්ෂ 1819 වන විට සම්පූර්ණ බයිබලය මුද්‍රණද්වාරයෙන් එළි දක්වා තිබුණු බව අප විසින් අනාවරණය කර ගැනුණු තොරතුරු අනුව පෙන්වා දිය හැකි ය.

- 1817 දී කොළඹ බයිබල සමාගමය විසින් නව ගිවිසුම (මතෙව්ගේ ශුභාරංචියේ පටන් යොහන්ගේ එළිදරව්ව තෙක්) චාතුර්පත්‍ර ප්‍රමාණයේ පිටු 800කින් යුක්ත ව පළ කරන ලදි. එම පිටු 800ට අමතර ව, ග්‍රන්ථාවසානයෙහි පිටු අටක ශෝධ්‍යපත්‍රයක් ද පිටු 14ක ගැටපද විවරණයක් ද එහි වෙයි.[62]
- පරණ තෙස්තමේන්තුවේ උත්පත්ති කථාවේ සිට දෙවන ලේකම් පොත තෙක් පිටු 668කින් සමන්විත බැඳි වෙළුමක් දක්නට ලැබේ. (1819)[63]
- එහි ම දෙවන වෙළුම වසයෙන් සැලකිය හැකි, 669 වන පිටුවෙන් ඇරඹෙන "ඇස්රාගේ පොතේ" සිට 972 පිටුවෙන් කෙළවර වන "යොබ්ගේ පොත" තෙක් කොටස ද ඉන් අනතුරු ව 1-228 තෙක් ගීතිකාවල් ද 1-69 හිතෝපදේශය ද 1-696 වසයෙන් උපදේශකයාගේ පොතෙහි පටන් මලකියස්ගේ පොත හෙවත් පුරාණ තෙස්තමේන්තුව අවසානය තෙක් ද දක්නට ලැබේ. වෙන් වෙන් පිටු අංක තිබීමෙන් පැහැදිලි වන්නේ ඒවා වාර කිහිපයක දී මුද්‍රණය කරන ලද බව යි.[64]

වර්ෂ 1901 දී, බ්‍රිතාන්‍ය පුස්තකාලයේ තැන්පත් කොට ඇති මුද්‍රිත සිංහල ග්‍රන්ථ නාමාවලියක් සකස් කළ ඩී. ඇම්. ද ඉසෙඩ්. වික්‍රමසිංහට අනුව මේ සමස්ත ක්‍රියාදාමය 1817-20 අතර වකවානුවේ සිද්ධ වූවකි.[65] වික්‍රමසිංහගේ ග්‍රන්ථ නාමාවලියේ දැක්වෙනුයේ ගීතිකා පොත හා උපදේශකයාගේ පොතෙහි පටන් මලකියස්ගේ පොත තෙක් කොටස් 1820 දී මුද්‍රණය කරන ලද බව යි. මේ අනුව පැරණි ගිවිසුමේ මුද්‍රණ කාර්යය නිම කෙරුණු වසර වන 1820 සම්පූර්ණ බයිබල පරිවර්තනය එළි දුටු වසර ලෙස සැලකිය හැකි ය.

මර්ඩොක් හා නිකොල්සන් ඔවුන්ගේ ග්‍රන්ථ නාමාවලිය පළ කරන අවධිය වන විටත් මුල් කාලයේ මුද්‍රිත පොතපත සුරැකි ව නො පැවති බව පෙනේ.[66]

---

60. Somaratna, (1991): 49.
61. Murdoch and Nicholsan, (1868):4.
62. ජා. කෞ. පු. 15 I 10. සකල ජනයන්ගේ ගැලවීම පිනිස ප්‍රකාශකරණලද අපගේ ස්වාමිවූ ගැලවුම්කාර යෙසුස්ක්‍රිස්තුස් වහන්සෙගේ අභිනව ගිවිසුම, කොළඹ බයිබල් සමාගම, 1817.
63. USJP. 225. S5, W - 514, 1318.
64. සුඬවූ බැයිබලය, කොළඹපුරප්‍රවරයෙහි බැයිබල් සමාගම වෙනුවෙන් සිංහල භාෂාවට පිටපත්කොට අච්චුගසන ලදි, Colombo, Wesleyan Mission Press, 1819.
65. Wickremasingha, D. M. de Z., (1901), *Catalogue of the Sinhalese Printed Books in the Library of the British Museum,* London: 19.
66. Murdoch and Nicholsan, (1868), "Preface": iii.

වික්‍රමසිංහ සිය ග්‍රන්ථ නාමාවලිය සකස් කරනුයේ අප සාකච්ඡා කරන මුල් මුද්‍රණ පළ වීමෙන් පන් සැත්තෑ වසකට පමණ පසුව වුව ද ඔහු අදාළ ග්‍රන්ථ දුටු බව පැහැදිලි ය. 1893 දී පළ කෙරුණු *Report of the Colombo Auxiliary Bible Society for the Year Ending 30th September 1892* නම් නම් ප්‍රකාශනය මෙම කාලවකවානු නිවැරදි ලෙස ගොඩ නඟා ගැනීමට ඉවහල් වන මූලාශ්‍රයයක් සේ හැඳින්විය හැකි ය.[67] එහි 10 - 11 පිටුවල දැක්වෙනුයේ පිළිවෙළින් වර්ෂ 1817 - 19 වකවානුවේ ටොල්ෆ්රිගේ බයිබල අනුවාදය පරණ තෙස්තමේන්තුවේ වෙළුම් තුනක් ද නව තෙස්තමේන්තුවේ එක් වෙළුමක් ද වසයෙන් පිටපත් දහස බැගින් පළ කෙරුණු බව හා වර්ෂ 1820 දී හා 1830 දී ටොල්ෆ්රිගේ බයිබල පරිවර්තනයේ සංශෝධනයක් හා නව මුද්‍රණයක් එළි දැක්වුණු බව යි. මර්ඩොක් හා නිකොල්සන් දක්වන 1823 වර්ෂය සනාථ කෙරෙන පරිදි අදහස් දක්වන සෝමරත්න ඊට සාධක වසයෙන් 1938 දී ලන්ඩන්හි පළ කෙරුණු *A Short History of the Ceylon Auxiliary Bible Society* නම් ප්‍රකාශනයක් දක්වතත් අදාළ පිටු අංකාදිය නො පෙන්වයි.[68] සෝමරත්න ඇතැම් විට මේ විස්තරය ගන්නට ඇත්තේ ඊ. ආර්. සරච්චන්ද්‍රගේ *The Sinhalese Novel* ඇසුරෙන් විය හැකි යැයි අනුමාන කළ හැක්කේ සරච්චන්ද්‍ර ද අදාළ තොරතුරු සඳහා මේ ප්‍රකාශනය ම මූලාශ්‍රය වසයෙන් දක්වන බැවිනි. එහෙත් සරච්චන්ද්‍ර අදහස් දක්වනුයේ නව තෙස්තමේන්තුව ගැන පමණි.[69] එස්. ජේ. ද ඇස්. වීරසිංහ දේවගැතිතුමා ද පවසනුයේ ටොල්ෆ්රිගේ පරණ ගිවිසුම් පරිවර්තනය 1823 දී කාණ්ඩ තුනකින් පළ වූ බව යි. එහෙත් එතුමා ද අදාළ මූලාශ්‍ර දක්වා නැත.[70] සෝමරත්න සිය ලිපිය සඳහා වීරසිංහ දේවගැතිතුමාගේ ලිපිය ද පරිහරණය කොට ඇති බව පෙනී යන හෙයින් ඔහු දුරදිග නො බලා ඉහත අදහස දක්වන්නට ඇතැයි නිගමනය කිරීමට අපට සිදු වෙයි.

ටොල්ෆ්රිගේ නව තෙස්තමේන්තුවේ සංශෝධනයක් 1827 දී පළ වූ බව සරච්චන්ද්‍ර පවසතත් ඉහත දැක්වූ බයිබල සමාගමයේ වාර්තාව අනුව නම් 1827 දී කිසිදු ධර්මග්‍රන්ථයක් පළ වී නොමැත. ඒ අනුව ටොල්ෆ්රිගේ පරිවර්තනයේ සංශෝධිත මුද්‍රණ පළ වී ඇත්තේ 1820 දී හා 1830 දී බව පැහැදිලි ය.

ටොල්ෆ්රිගේ නව තෙස්තමේන්තු අනුවාදය පිළිබඳ ව සරච්චන්ද්‍ර හා සෝමරත්න පෙන්වා දෙන පරිදි ටොල්ෆ්රි ජීවත් ව සිටිය දී ම ඉහත සඳහන් දේවගැතිවරුන් තිදෙන ඔහුට සහාය පළ කොට තිබේ.[71] එහෙත් පූර්වෝක්ත කොළඹ බයිබල් සංගමයේ 1817 සඳහා වන වාර්ෂික වාර්තාව අනුව පෙනී යන්නේ ටොල්ෆ්රිගේ අභාවයෙන් පසු ව මේ තිදෙන මුල් වී එම කාර්යය ඉදියට ගෙන ගිය බවකි. "නව පරිවර්තනය මේ තිදෙනාගේ අධීක්ෂණයෙන් සිදු වූ අතර ... සතියකට සිව් වරක් මේ අය වෙස්ලියන් මිෂන් හවුස්හි දී රැස් වෙති."[72] පරණ තෙස්තමේන්තුව ද මේ තිදෙන හා ලෙයාර්ඩ් මහතා විසින් පරිවර්තනය කෙරෙන බව එහි දැක්වේ. ඊට අමතර ව, නව තෙස්තමේන්තු පරිවර්තනය සංශෝධනය කිරීමේ කාර්යය ද 1817 ඔක්තෝබර මාසයේ ආරම්භ කරන ලද බව පැවසේ.[73] සුධවූ බැයිබලය/

67. *Report of the Colombo Auxliary Bible Society for Year Ending 30th September 1892*, Colombo. 1893. (ජා. කෞ. පු. 50 A 26)
68. Somaratna, 1991: 49.
69. Sarathchandra, 1950: 21.
70. Weerasinghe, 1952: 74.
71. Sarathchandra, 1950:74; Somaratna, 1991: 48.
72. *Report of the Colombo Auxilary Bible Society for the Year Ending 30th September 1892*:10-11.
73. Ibid:21.

කොළඹ පුරප්‍රවරයෙහි බැයිබල් සමාගම වෙනුවෙන් සිංහල භාෂාවට පිටපත් කොට අච්චු ගසන ලදි/ Colombo/ Printed at the Wesleyan Mission Press 1819 යන ග්‍රන්ථනාම පිටුව සහිත, චාතුර්පත්‍ර ප්‍රමාණයේ පිටු 1965කින් යුක්ත ව හමු වන දෙවෙළුම් ග්‍රන්ථය 1817 දී පළ වූ නව ගිවිසුම හා පරිවර්තක මණ්ඩලයේ පරිශ්‍රමයේ ද එකතුව විය හැකි බව පෙනේ.[74]

ටොල්ෆ්රි විසින් සිංහල අනුවාදය හා සමගාමී ව නව ගිවිසුමේ පාලි අනුවාදයක් ද සකසන ලද බව පැවසේ.[75] තත්කාලීන පැවිදි පඬිවරුන් දෙපලක වන කරතොට ධම්මාරාම හා බෝවල ධම්මානන්ද හිමිවරුන් එහි ලා ටොල්ෆ්රිට උපකාර කළ බව සෝමරත්න පවසා ඇතත්[76] ඔහු ඒ සඳහා ඉදිරිපත් කරන මූලාශ්‍රය සටහන් දෙකෙහි[77] නම් එවැනි සඳහනක් දැකිය නො හැකි ය. භික්ෂූන් වහන්සේ සිය ආගමික හා ශාස්ත්‍රීය ඥානය එක් පක්ෂයකට පමණක් අයත් සේ සලකා කටයුතු නො කළ බව පෙන්වීම සඳහා බෞද්ධ - ක්‍රිස්තියානි විසංවාද පිළිබඳ අධ්‍යයනයක දී කිත්සිරි මලල්ගොඩ ද මෙකරුණ ම ගෙන හැර පායි.[78] 1812 දී කොළඹ උපකාරී බයිබල සමාගමය බයිබල පරිවර්තන කාර්යය ඇරඹූ කල පහත රට පැවිදි පඬිවරුන් දෙපලක වන කරතොට ධම්මාරාම හා බෝවල ධම්මානන්ද යතිවරුන් අකැමැත්තකින් තොර ව ඊට සහාය පළ කළ බවත් මේ කාර්යයේ දී දොන් ජාකොබ් දියස් මුදලිවරයා හා මුහන්දිරම් පවුලස් පෙරේරා දෙපලගෙන් ද ටොල්ෆ්රිට සහාය ලැබුණු බවත් පවසන මලල්ගොඩ සිංහල පරිවර්තන සම්පාදනයේ දී මුලින් ම දොන් ඒබ්‍රහම් ද තෝමස් (ඇළපාත) මුහන්දිරම් ලවා ඉංගිරිසි බයිබලය හා පාලි බයිබල පරිවර්තනය සැසඳවුණු බව ද පාලි හා සිංහල පරිවර්තන යථෝක්ත යතිවරුන් ලවා සැසඳවුණු බව ද පවසයි. එහෙත් ඔහු ද අදාළ මූලාශ්‍රය සටහන ඉදිරිපත් කොට ඇති ආකාරය සැක උපදවනසුලු ය. මලල්ගොඩ මේ සඳහා මූලාශ්‍රය වසයෙන් දක්වන්නේ 1813 දී ප්‍රකාශිත *The First Report of the Colombo Auxiliary Bible Society* නම් ලේඛනයකි. එහෙත් ඔහු අදාළ පරිච්ඡේදය හෝ පිටු අංකාදිය හෝ නො දක්වයි.

කෙසේ වුව ද, ටොල්ෆ්රිගේ නව තෙස්තමේන්තු සිංහලානුවාදය එහි භාෂා විලාසය හේතුවෙන් උසස් තත්ත්වයක ලා සලකනු ලැබේ.[79]

---

74. ජා. කෞ. පු. 15 I 10.
75. මර්ඩොක් හා නිකොල්සන් පවසනුයේ මෙම පාලි පරිවර්තනයෙන් පිටපත් 500ක් 1835 දී පළ කරන ලද බවයි. 1892 වසර සඳහා වන කොළඹ බයිබල් සමාගමයේ වාර්ෂික වාර්තාව පිටපත් සංඛ්‍යාව අතින් මේ හා එකඟ වුව ද ප්‍රකාශිත වර්ෂය දක්වා ඇත්තේ 1840 ලෙසය. *"The New Testament of Our Lord and Saviour Jesus Christ* (Translated into Pali), 1835, Wesleyan Mission Press" යනුවෙන් සඳහන් ග්‍රන්ථ නාම පිටුව සහිත ව බුරුම අකුරින් මුද්‍රිත ග්‍රන්ථය මේ විය යුතු ය.
76. Somaratna, 1991:48.
77. සෝමරත්න පෙර සඳහන් ලිපියේ 48 පිටුවට අදාළ ව 63 පිටුවෙහි දක්වා ඇති මූලාශ්‍රය සටහනෙහි එන ජේම්ස් ද අල්විස්ගේ සිදත් සඟරා පරිවර්තනයේ සංඥාපනයේ අදාළ පිටු අංක ද නිවැරදි නො වේ. එය lxxxiv - cxi (84-111) නොව lxxxiv - lxxxviii (84-88) විය යුතුය. *The Orientalist* සඟරාවේ (1889) III වෙළුම 204-207 පිටුවල ද එබඳු ප්‍රකාශයක් දැකිය නො හැකි ය.
78. Malalgoda, Kithsiri, (1976), *Buddhism in Sinhalese Society 1750 - 1900*, London: 111. මෙහි ද මූලාශ්‍රය දක්වා ඇතත් අදාළ පිටු අංකාදිය නො දැක්වේ.
79. Sarathchandra, 1950:75.

2. වෙස්ලියානු ධර්මදූතායතනයේ මුද්‍රණාලය

වර්ෂ 1815 දී වෙස්ලියානු ධර්මදූතායතනය මුද්‍රණාලයක් ආරම්භ කිරීම බයිබල මුද්‍රණ කාර්යය ඉක්මන් කරවීමෙහි ප්‍රබල හේතුවක් විණැයි පැවසේ. කොළඹ බයිබල සමාගමයේ මුද්‍රණාලය සතු ව පැවති උපකරණ 1816 දී වෙස්ලියානු ධර්මදූතායතනයේ මුද්‍රණාලය වෙත ගෙන යනු ලැබිණි.[80]

3. කෝට්ටේ අනුවාදය

තත්ත්වය මෙසේ පවතිද්දී, බයිබලයේ නව පරිවර්තනයක් කළ යුතු යැයි වර්ෂ 1821 දී සැමුවෙල් ලැම්බ්රික් දේවගැතිවරයා කොළඹ බයිබල සමාගමයට යෝජනා කෙළේ ය.[81] සමාගමය එම යෝජනාව ප්‍රතික්ෂේප කෙළෙන් ලැම්බ්රික් ජේ. සෙල්කර්ක් ආදීන් හා එක් ව නව බයිබල පරිවර්තනයක් ආරම්භ කෙළේ ය.[82] මෙය චර්ච් මිෂන් සමාගමය නම් වූ නිකායයේ මූලිකත්වයෙන් සිදු කෙරිණි. මෙම නව පරිවර්තනය 1832 දී එළි දැක්විණි; එය "කෝට්ටේ අනුවාදය"(Cotta Version) නමින් හැඳින්වේ.[83] ටොල්ෆ්රි විසින් ආරබ්ධ, 1817 - 19 වකවානුවේ එළි දුටු සිංහල බයිබලය "දෙවියන් වහන්සේ විසින් ම දේශනා කරන ලද මුල් ග්‍රන්ථයේ වූ සාරල්‍යයෙන් තොර වීම" (එනම් විදග්ධ සිංහලයෙන් ලියවී තිබීම) නිසා තමන් බයිබලයේ භෂාව හැකි තාක් කථා ව්‍යවහාරයේ භාෂා රීතියට ළං කරන බව කෝට්ටේ අනුවාදකයෝ පැවසූහ.[84]

මේ ලිහිල් භාෂා ප්‍රතිපත්තිය හේතුවෙන් කෝට්ටේ අනුවාදය භාෂණ - ලේඛන ව්‍යවහාර ද්වයයෙන් එකකටදු නො ගැළපෙන අපභ්‍රෂ්ට ශෛලියකින් යුක්ත වූයේ ය.[85] එය ආගමික විෂයයකට නො ගැළපෙන ග්‍රාම්‍ය වූවක් බැවින් ඒ කෙරෙහි උගත් කිතු බැතිමතුන්ගේ විවේචන එල්ල විය.[86] කොළඹ හා උපනගරවල විසූ මුල් පෙළේ ක්‍රිස්තියානීහු කොළඹ බිෂොප්වරයාට පෙත්සමක් යවමින් සම්මත බයිබල පරිවර්තනයක් එළි නො දක්වන තුරු ඒ ඒ සභාවට තමන් කැමති බයිබල අනුවාදයක් භාවිත කිරීමට අවසර දෙන බවට ප්‍රකාශයක් නිකුත් කරන ලෙස ඉල්ලූහ. එසේ නො කෙරෙතොත් මැවුම්කරු, ගැලවුම්කරු හා ශුද්ධවන්තයා හැඳින්වීමට නින්දනීය වචන නො යෙදුණු බයිබල පරිවර්තනයක් භාවිත කරන වෙනත් නිකායයකට සම්බන්ධ වන බව ඔවුහු කියා සිටියහ.[87] මේ විරෝධතා නො තකා චර්ච් මිෂන් සමාගමය සිය පරිවර්තනය ආරක්ෂා කිරීමෙහි නිරත විය. මේ මත ගැටුම දසක දෙකකට ආසන්න කාලයක් ඇද්දෙමින් ආ අතර එයින් පැහැදිලි වූයේ කෝට්ටේ අනුවාදයේ භාෂා ශෛලිය ක්‍රිස්තු භක්තිකයන්ගේ අප්‍රසාදයට ලක් වූවක් බව යි. එල්ල වූ අපවාද හේතුවෙන් අවසානයේ දී චර්ච් මිෂන් සමාගමයට සිදු වූයේ එම ඉල්ලීම්වලට කන් දීමට යි.[88]

---

80. Murdoch and Nicholsan, 1868:5.
81. Ibid.
82. Ibid.
83. ජේම්ස් ද අල්විස්, මර්ඩොක් හා නිකොල්සන්, සරච්චන්ද්‍ර, සරත්චන්ද්‍ර වික්‍රමසූරිය හා සෝමරත්න යන පූර්ව පර්යේෂකයෝ මෙය Cotta Version යි නම් කරති. සරච්චන්ද්‍ර එය "කෝට්ටේ අනුවාදය" යි සිංහලයට නඟා ඇත.
84. Somaratna, 1991:49; n. 32 in p.63.
85. Sarathchandra, 1950:75.
86. ප්‍රමුඛ පෙළේ සිංහල ක්‍රිස්තියානි උගතකු වූ ජේම්ස් ද අල්විස් 1852 දී පළ කළ සිදත් සඟරා පරිවර්තනයේ සංඥාපනයේ දී කෝට්ටේ අනුවාදය දැඩි ලෙස විවේචනයට ලක් කරයි. *The Sidath Sangarawa - A Grammar of Sinhalese Language*, (1852): lxxxiv - lxxxviii.
87. Somaratna, 1991: 50-51.
88. Ibid.

මේ පසුබිම මත සියලු ම රෙපරමාදු නිකාය නව පොදු පරිවර්තනයක් සඳහා යොමු වූ බව පෙනේ.[89]

4. දේශීය ද්විභාෂක උගතුන්ගේ බයිබල පරිවර්තනය

වොල්ෆ්රිගේ හෝ කෝට්ටේ හෝ පරිවර්තනවලින් තෘප්ත නො වූ ජෝන් පෙරේරා හා ජේම්ස් ද අල්විස් වැනි ප්‍රමුඛ පෙළේ සිංහල ක්‍රිස්තියානි උගතුන්ගේ ක්‍රියාකාරිත්වයෙන් යුතු ව නව බයිබල පරිවර්තනයක් සම්පාදනය 1852 දී ආරම්භ විය.[90] ජේම්ස් ද අල්විස් කෝට්ටේ පරිවර්තනයේ භාෂා ව්‍යවහාරය සම්බන්ධයෙන් දීර්ඝ විවේචනයක් ඉදිරිපත් කොට තිබිණි.[91] නව පරිවර්තනය සඳහා දේවගැතිවරුන් 16 දෙනකුගෙන් ද ගිහි උගතුන් 11 දෙනකුගෙන් ද සමන්විත කමිටුවක් පත් කෙරිණි. ගිහි උගතුන්ගෙන් වැඩි දෙනා සිංහලයෝ වූහ. ඩී.ජේ. ගොගර්ලි පියතුමා මෙම පරිවර්තන කාර්යයෙහි ප්‍රධානත්වය ඉසුලුවේ ය. මීට ඇතුළත් වූවාහු වෙස්ලියන් හා ඇංග්ලිකන් සභිකයෝ පමණක් වූහ. මේ පිරිසගේ කාර්ය' සාධනයේ ප්‍රතිඵල වසයෙන් සම්පූර්ණ බයිබල පරිවර්තනය 1885 දී මුද්‍රණද්වාරයෙන් එළි දක්වනු ලැබිණි. එහෙත් ඊට පෙර පරිවර්තනය කොට අවසන් කෙරුණු කොටස් වරින් වර මුද්‍රණය කෙරිණි.[92]

5. බැප්ටිස්ට් පරිවර්තනය

සෙසු නිකායයන් දිවයින පුරා ම ධර්මප්‍රචාරක කටයුතුවල නිරත වෙද්දී බැප්ටිස්ට් නිකායය සිංහල කතා කරන ජනයා වෙසෙන ප්‍රදේශ සිය ඉලක්කය කර ගත් බව පෙනේ. මේ නිකායයට අයත් ධර්මදූතයෝ සිංහල භාෂාවෙහි ප්‍රවීණත්වයක් ලැබීමට උත්සුක වූවෝ ය. (තන්නිකායික චාර්ල්ස් කාර්ටර් දේවගැතිවරයාගේ සිංහල - ඉංගිරිසි හා ඉංගිරිසි - සිංහල ශබ්දකෝෂ අදත් සම්භාවනාවෙන් සලකනු ලැබේ.)

ජේම්ස් චේටර් දේවගැතිවරයාගේ ප්‍රධානත්වයෙන් බැප්ටිස්ට්වරුන්ගේ බයිබල පරිවර්තනයේ කටයුතු ආරම්භ කෙරිණි. 1829 දී ඔහු මිය ගියෙන් එච්. හැරිස් එම කටයුතු ඉදිරියට ගෙන ගියේ ය. චාර්ල්ස් කාර්ටර් ද එහි ලා ක්‍රියාකාරී දායකත්වයක් දැක්වී ය. 1859 දී ශුද්ධ වූ යොහාන්ගේ ශුභාරංචියත්, 1862 දී නව තෙස්තමේන්තුව[93] හා 1876 පුරාණ තෙස්තමේන්තුවත් එළි දක්වන ලදි. පුරාණ තෙස්තමේන්තුව මුද්‍රණය කොට ඇත්තේ ද්විත්ව තීරු ක්‍රමයට යි. බැප්ටිස්ට් නිකායයේ බයිබල පරිවර්තනය හීබ්රූ හා ග්‍රීක බයිබල මුල් කොට ගෙන සිදු කෙරිණි. ඉංගිරිසි බයිබල පරිවර්තනය නව සිංහල පරිවර්තනයේ හරි වැරදි පරීක්ෂාව සඳහා පමණක් භාවිතයට ගැනිණි. වර්තමාන බයිබල පරිවර්තන සඳහා ද මේ කෘතිය මූලාකෘතිය සේ භාවිත කෙරේ.[94]

---

89. Weerasinghe, 1952: 74.
90. Somaratna, 1991: 51.
91. Alwis, 1852: lxxxiv - lxxxviii.
92. Somaratna, 1991: 51-52.
93. අළුත් ගිවිසුම නම් සුධලියවිලිය, (1862), බැප්ටිස්ට් මිෂියොනාරිස් සමාගම, දෙවන මුද්‍රණය, 1881; තෙවන මුද්‍රණය, 1892.
94. Somaratna, 1991: 52-53.

### 6. නව පරිවර්තන

1881 දී බයිබලයේ ඉංගිරිසි පරිවර්තන ප්‍රතිශෝධනය ඇරඹිණි. ඉංගිරිසිය දිවයිනේ සමයාන්තර ඥාන විතරණ මාධ්‍යය බවට පත් වීමෙන් අනතුරු ව ප්‍රතිශෝධිත සම්මත ඉංගිරිසි සංස්කරණය සිංහල බයිබල පරිවර්තකයන්ට ද අත්‍යවශ්‍ය ග්‍රන්ථයක් බවට පත් විය. මේ සමඟ ම නව සිංහල බයිබල පරිවර්තනයක අවශ්‍යතාව ද මතු වූයෙන් 1885 දී බයිබල සංගමය නව සිංහල බයිබල පරිවර්තනයකට මුල පිරුවේ ය. මෙකී ප්‍රතිශෝධිත පරිවර්තන 1909 දී හා 1910 දී නිකුත් කෙරිණි.[95]

### ආදි ම සිංහල ක්‍රිස්තියානි ධර්මග්‍රන්ථයන්හි භාෂා ලක්ෂණ

සිංහල භාෂාව ක්‍රිස්තු පූර්ව තෙවන සියවස තරම් අතීතයක සිට වර්තමානය තෙක් වන දීර්ඝ කාල පරිච්ඡේදයක් තුළ පැතිර ගිය අඛණ්ඩ ලේඛන සන්තතියකින් යුක්ත භාෂාවකි.[96] සිංහල භාෂාවේ විකාසනය ප්‍රධාන භාෂා යුග තුනේ සිට සය තෙක් සංඛ්‍යාවකට බෙදා සාකච්ඡා කෙරේ.[97]

අපේ අධ්‍යයනයට බඳුන් වන සිංහල ක්‍රිස්තියානි සාහිත්‍යය මේ යුග බෙදුම් අතරින් "නූතන සිංහල යුගය" යනුවෙන් හැඳින්වෙන භාෂා යුගයට අයත් වේ. සිංහල භාෂා ඉතිහාසයේ වඩාත් ප්‍රචලිත යුග බෙදුම වන, විල්හෙල්ම් ගයිගර් විසින් වර්ෂ 1936 දී රචිත *A Grammar of the Sinhalese Language* කෘතියෙහි පැනෙන භාෂා යුග බෙදුම අනුව "නූතන සිංහල යුගය" වූ කලි ක්‍රිස්තු ක්‍රිස්තු වර්ෂ තෙළෙස් වන සියවසේ මධ්‍ය භාගයෙහි පටන් අද්‍යතනය තෙක් යුගය යි.[98] ගයිගර්ගේ ප්‍රචලිත යුග බෙදුමෙහි ඇතුළත් නූතන සිංහල යුගය කාල වකවානු වසයෙන් අතිදීර්ඝ වූවක් වන අතර භාෂා ලක්ෂණ අතින් එහි මුල් භාගය පූර්ව භාෂා අවධිය වන "මධ්‍ය සිංහල යුගය" හා සම්බන්ධ කළ හැකි වේ. සතළොස් වන සියවසින් පසු කාල වකවානුව සාහිත්‍යකරණය උගතුන් අතින් සාමාන්‍ය ජනයා කරා මාරු වීම, ලේඛනයෙහි ලා සම්මත භාෂාප්‍රයෝග කෙරෙන් ඉවත් වීම, සමකාලීන භාෂණ ව්‍යවහාරය ලේඛනය සඳහා යොදා ගැනීම, සිංහලය කෙරෙහි දෙමළ බලපෑම වැඩි වීම හා පෘතුගීසි, ලන්දේසි භාෂාවන්හි බලපෑම ප්‍රකට වීම යන ලක්ෂණ සලකමින් නව්‍ය භාෂා යුගයක් සේ සැලකීම යුක්ති සහගත ය. පූර්වෝක්ත භාෂා යුග බෙදුම සංශෝධනයට උගතුන් පෙලඹී ඇත්තේ මේ කරුණු සැලකිල්ලට ගැනීමෙන් බව පෙනේ.[99] ඒ අනුව අපේ අධ්‍යයනයට බඳුන් වන අටළොස් වන සියවසේ ආරම්භයේ

---

95. Somaratna, 1991: 53.
96. පරණවිතාන, සෙනරත්, (1856), "සිංහල භාෂා පරිණාමය", **ශ්‍රී සුමඞ්ගල ශබ්දකෝෂය**, සංස්. වැලිවිටියේ සෝරත හිමි, (කාණ්ඩ දෙකකි.), ද්විතීය භාගය: (ප-ළො), ද්විතීය මුද්‍රණය, 1970, ගල්කිස්ස: 1205.
97. විල්හෙල්ම් ගයිගර් සිංහල භාෂා ඉතිහාසය අධ්‍යයනයේ දී "සිංහල ප්‍රාකෘත යුගය", "පුරාතන සිංහල යුගය", "මධ්‍ය සිංහල යුගය", "නූතන සිංහල යුගය" යනුවෙන් යුග හතරක් ද (Geiger, Wilhelm, (1938), *A Grammar of the Sinhalese Language*, Colombo: 1-8) පසුව "නූතන සිංහල යුගය" "(අ) සම්භාව්‍ය සාහිත්‍ය යුගය" හා "(ආ) නූතන සිංහල යුගය" යනුවෙන් දෙකට කඩා යුග පහක්ද (Geiger, Wilhelm, (1937), "Linguistic Character of Sinhalese", *J. R. A. S. (C. B.)* Vol. XXXIV, No. 90: 16-43.) ඉදිරිපත් කෙළේ ය. විමල් ජී. බලගල්ලේ 1992 දී "සිංහල ප්‍රාකෘත යුගය", "මධ්‍ය සිංහල යුගය" "නූතන සිංහල යුගය" පූර්ව හා අපර භාග වසයෙන් ද්විභේද කොට යුග සයක් හඳුන්වා දුන් අතර (බලගල්ලේ, විමල් ජී., (1992), **සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය**, කොළඹ : 50-51.) 1995 දී "සිංහල ප්‍රාකෘත යුගය", "මධ්‍ය සිංහල යුගය", "නූතන සිංහල යුගය" යනුවෙන් ප්‍රධාන යුග තුනක් (මුල් යුග දෙක පූර්ව, මධ්‍ය හා අපර භාග වසයෙන් ත්‍රිභේද කොට ද "නූතන සිංහල යුගය" පූර්ව හා අපර භාග වසයෙන් ද්විභේද කොට ද) හඳුන්වා දුන්නේ ය. (බලගල්ලේ, විමල් ජී., (1996), **සිංහල භාෂාවේ ප්‍රභවය හා ප්‍රවර්ධනය**, සංස්කෘතික පුස්තිකා මාලා - 5, බත්තරමුල්ල: 53-54).
98. *A Grammar of the Sinhalese Language* කෘතිය 1936 දී ලිඛිත වුව ද ප්‍රකාශයට පත් වූයේ 1938 දී බැවින් 1937 දී පළ වූ "Linguistic Character of Sinhalese" ලිපියෙහි ආ අභිවර්ධිත මතය ප්‍රචලිත නො විණි.
99. බලගල්ලේ, 1992 : 50; බලගල්ලේ, 1996: 50-53.

සිට එකුන්විසි වන සියවසේ මධ්‍ය භාගය තෙක් වන කාලපරිච්ඡේදය සිංහල භාෂා පරිණාමයේ "නූතන යුගයේ පූර්ව භාගය" ලෙස සැලකීම යුක්තියුක්ත බව කිව යුතු ය.[100]

මේ අධ්‍යයනයෙහි ලා අපේ අවධානයට ලක් වන ලේඛන මෙකී නව්‍ය භාෂා යුගයට අයත් ලක්ෂණ ප්‍රකට කරන බව පෙන්වා දිය හැකි ය.

සිංහල ක්‍රිස්තියානි/ කතෝලික ධර්මග්‍රන්ථ හා බයිබල පරිවර්තන බිහි වූයේ පෘතුගීසීන් විසින් අරඹන ලදු ව ලන්දේසීන් හා ඉංගිරිසීන් විසින් පවත්වා ගෙන ආ ක්‍රිස්තු ලබ්ධි ප්‍රචාරණ ක්‍රියාවලියෙහි ඵලයක් වසයෙනි. එහි ලා සාම්ප්‍රදායික අධ්‍යාපන ආයතන - එනම් පිරිවෙන හා පන්සල - යටපත් කිරීමේ ක්‍රියාදාමයක් ද පැවතිණි.[101] අටළොස් වන සියවසේ ආගමික හා භාෂා ශාස්ත්‍ර පුනර්ජීවනයේ පුරෝගාමියා වූ වැලිවිට සරණංකර හිමියන්ට ප්‍රාචීන භාෂා අධ්‍යයනයේ දී මුහුණ පෑමට සිදු වූ ගැටලු යථෝක්ත ක්‍රියාදාමයේ ප්‍රතිඵලයකි.[102] ශාස්ත්‍රීය පුනර්ජීවනයේ පුරෝගාමියා වූ සරණංකර හිමියන්ගේ පවා සිංහල භාෂා ව්‍යවහාරය ව්‍යක්ත වූවක් නො වී ය.[103] මෙකී පසුබිමෙහි ග්‍රන්ථකරණයට පිවිසි සිංහල උගත් විදේශිකයන් නැත හොත් අබෞද්ධ සිංහලයන් අතින් සම්පාදිත සිංහල ක්‍රිස්තියානි/ කතෝලික සාහිත්‍යයෙහි ව්‍යක්ත සිංහල ව්‍යවහාරය රැකී ඇතැයි අපේක්ෂා කළ නො හේ. ඉහතින් සඳහන් කෙරුණු පරිදි වෙන ම භාෂා යුගයක් සේ සැලකීමෙහි ලා සාධකයක් වන, සිංහල වාක්කෝෂයට පෘතුගීසි හා ලන්දේසි වාඞ්මාලාවක් ඇතුළු වීම තත්කාලීන සංස්කෘතික සංස්පර්ශයෙහි ප්‍රතිඵලයකි.[104]

මෙම ලේඛන, ඒවායේ කිසියම් සාහිත්‍යික අගයක් නැතත් සිංහල භාෂා ඉතිහාසය හැදෑරීමේ ලා මහඟු මූලාශ්‍රයක් වන තව ද කරුණු දෙකක් පෙන්වා දිය හැකි ය.

ක්‍රිස්තු පූර්ව තෙවන සියවසේ සිට සතළොස් වන සියවස තෙක් ලිඛිත සිංහල පුරාලේඛන හා ගද්‍ය - පද්‍ය කෘති ප්‍රධාන වසයෙන් ම සිංහලයේ විධිමත් ලේඛන ව්‍යවහාරය අනුයමින් ලියවුණු ඒවා වීමත් මෙම සිංහල ක්‍රිස්තියානි/කතෝලික ධර්මග්‍රන්ථ හා බයිබල පරිවර්තන විධිමත් ලේඛන ව්‍යවහාරය නොව, - ඇතැම් විට විධිමත් ලේඛන ව්‍යවහාරයට වඩා -, භාෂණ ව්‍යවහාරය අනුයමින් රචනා වී තිබීමත් ඉන් එකකි. සංස්කෘතික සංස්පර්ශය හේතුවෙන් සිංහලයට එක් වූ යුරෝපීය

100. එකුන් විසි වන සියවසේ මධ්‍ය භාගයෙහි පමණ සිට ප්‍රාචීන භාෂාධ්‍යයනය ව්‍යාප්ත වීම හා තදාශ්‍රිත ශාස්ත්‍රීය ප්‍රබෝධය නව සන්නිවේදන මාධ්‍යයන්හි වර්ධනය (මුද්‍රණ ශිල්පයේ ව්‍යාප්තිය), නව සාහිත්‍යික ප්‍රවණතා පහළ වීම යනාදි සාධක හේතු කොට ගෙන සිංහල භාෂාවේ සිදු වූ විපරිණාමය සලකමින් එකුන් විසි වන සියවසේ මධ්‍ය භාගයෙහි පටන් අවධිය "නූතන සිංහල යුගයේ අපර භාගය" සේ සැලකේ. බලගල්ලේ, 1992:53.

101. මේ යුරෝපීය ආක්‍රමණික ජාතීන්ගේ හිංසාකාරී ක්‍රියා පිළිබඳ විස්තර මතු සඳහන් ග්‍රන්ථයන්හි දැක්වේ: අබයසිංහ, 1969:190-200; අබයසිංහ, 1966 : 96-99; සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර, (1961), **සිංහල සාහිත්‍ය වංසය**, කොළඹ : 244-245, 305-312; තෙන්නකෝන්, විමලානන්ද, (1963), *Buddhism Under the Christian Power,* Colombo: 143; සෝමරත්න, ජී. පී. වී., (1962), **ලංකාවේ ක්‍රිස්තියානි ආගම**, නුගේගොඩ: 46, 74-76; අරසරත්නම්, එස්., (1969), **ලංකාවේ ලන්දේසි බලය (1658-1687)**, කොළඹ: 220-242. ලන්දේසීහු ස්වකීය ආගම ප්‍රචාරයෙහි දී පෘතුගීසීන් විසින් ආරබ්ධ කතෝලික නිකාය කෙරෙහි ද ප්‍රහාරාත්මක වූහ: වාචිස්සර හිමි, කොටගම, (1960), **සරණඞ්කර සඞ්ඝරාජ සමය**, දෙවන මුද්‍රණය, (1964), කොළඹ: 40 පිටුවේ සිට ඉදිරියට.

102. වාචිස්සර හිමි, 1964: 158; අබයසිංහ, ටිකිරි සහ තවත් අය, (1977), **උඩරට රාජධානිය 1470-1818**, කොළඹ: 102.

103. වාචිස්සර හිමි, 1964:178-79, 213-16; බලගල්ලේ, 1996: 64-65.

104. බලගල්ලේ, 1996: 64-65: 68-70.

භාෂාමය වාක්කෝෂයෙහි සාම්ප්‍රදායික ව්‍යාකරණඥයන්ගේ හෝ ඓතිහාසික වාග්විද්‍යාඥයන්ගේ ප්‍රමාණවත් අවධානයකට පාත්‍ර නො වූ විශේෂ පරිමිත ව්‍යවහාරයකට අයත් නිදසුන් ලද හැකි වීම අනෙක යි. සංස්කෘතික සංස්පර්ශය හේතුවෙන් සිංහලයට එක් වූ යුරෝපීය භාෂාමය වචන පිළිබඳ ව අවධානය යොමු කළ විද්වතුන් මෙතෙක් යොමු වී ඇත්තේ ආහාරපාන, ඇඳුම් පැළඳුම්, සමාජ සංවිධානය හා නීතිරීති සම්බන්ධ වචන කෙරෙහි පමණි.[105] මේ ලේඛන පරිමිත භාෂා තත්ත්වයක් සේ සැලකිය හැකි ආගමික ව්‍යවහාර හා සම්බන්ධ භාෂාමය නිදර්ශන රැසක් අප හමුවේ තබයි.

පහත දැක්වෙනුයේ ප්‍රථම මුද්‍රිත සිංහල ග්‍රන්ථය වන *Singaleesch Gebeede Boek*හි (1737) උද්ධෘතයකි :

"ප්‍රදානවූයාඥාවල් පහද අපෙ ක්‍රිස්තියානි ඇදිහිල්ලෙ පංගු දොලහ සහ දෙවිස්වාමිදුරුවානන්වහන්සෙම අහස්තලින් දෙවාවදාල අනාඥාවල් දසයද මෙහි ඇත".
"මුල ආරඹයැ සෙනෙහෙවන්තවූ සිංහලෙ අයෙනි තමාලාගෙ ගැලවීමෙහි පුරුදුවීමටද දීප්තිවීමටද වෙනුව ගුස්තාව් විල්ලම් වන් ඉම්හොව්යන ගරුතර ගොවැණීණිදෝරු උතුමානන්වහංසෙගෙ එනිවුඩපනත සැටියට පලමුවෙන් අච්චුගසන්ට යෙදුනු මේපොත දෙවියන්වහංසෙටද තමන් පැමිනිතැන්වලටදයුතුවූ ස්තුතිකෙරීමෙන් ඔප්පුගනුව".

විල්හෙල්ම් කොන්යින් විසින් ග්‍රීක භාෂාවෙන් සිංහලයට පරිවර්තිත, ජේ. පී. වෙට්සෙලියුස් විසින් සංශෝධිත, 1739 දී මුද්‍රණද්වාරයෙන් එළි දුටු අපගෙ **නායකවූ ගැලවුම්කාර/ යෙසූස් ක්‍රීස්තුස් වහංසෙගෙ/ සුධවූ එවුඅන්ජෙලිය/** (මතෙඵවුස් මක්කුස් ඵැකස් යොහනෙස්/ යන දෙවියන්වහන්සෙගෙන් එවාවදාරනඩ යෙදුනු අයවල් නැමැති සුධවූ/ එවුඅන්ජෙලිස්තවරුන්ගෙන් ලියවුනු හැටියැ) යන හිසින් යුතු බයිබල පරිවර්තනයෙහි සංඥාපනයෙන් කොටසක් මතු දැක්වේ:

"එහෙනම් දැන්දී එලිදරවුවෙන මේ එවුඅංගෙලිවුම් හතර සිංහල බාසාවෙ අක්‍ෂුවලින් අච්චුගැසුනාට සන්තොසව කියවන අයෙනි ගුස්තාවු විල්ලොම් වන් ඉම්හොවු අපගේ ගරුතර ගොවෙණීණදෝරු උතුමානන්වහංසෙගේ ගැහැනිනොමවූ කඩිසරකමටත් සෙනෙහෙවන්ත වූ පියානන් කෙනෙක් මෙන් කල ප්‍රවෙසමේකෙරීමටත් වෙනුව ඉස්තුතිකරනවාහොඳෙ මෙම ගරුතර උතුමානන්වහංසේ දෙවියන්වහංසෙ වෙතට ගෙනයන සැබෑවූ මාර්ගය සිංහල අය අතුරෙහි දිවුනුකෙරීමටත් ආදරයෙන් තමුන්නෙ ආත්මවල සදාකාල සොඳකමටත් වෙනුව දෙවියන්වහංසෙගෙ ප්‍රාක්‍රමවූ පිහිටෙන් මේ සිංහල අක්‍ෂු අච්චුගැසීම දැවුරුද්දක් ඇතුලතදී

105. බලගල්ලේ, 1996: 68-70 : Wood House, Edmond, (1884), "Influence of the Portuguese and Dutch Languages on the Sinhalese and Tamil", *The Orientalist,* Vol.I, Oct. 1884: 223-26; (1886): "On Some Portuguese Words Adopted by the Sinhalese", *The Orientalist,* Vol.III, 1886: 41-56; Bultjens, A. E., (1886), "On Some Dutch Words Commonly Used by the Sinhalese", *The Orientalist,* Vol.III, (1886): 104-7; Nell, Louis, (1886), "An Explanatory list of Dutch Words Adopted by the Sinhalese", *The Orientalist,* Vol. III, 1886: 144-48; Gunasekara, A. M., (1891), *A Comprehensive Grammar of the Sinhalese Language,* 2nd edition, 1964, Colombo: 35-42.

පූන්ඩුකලා පමනක් නොව එහෙත් බාග්ගවන්තව නෙම්මුතුකලා ඇත
මීට දෙවියන්වහංසේට නිම්මයක් නැති ඉස්තුතිවෙත්වා"

1744 දී පළ වූ පරිවර්තක අඥාත සිංහල දේව මෙහෙය සංග්‍රහයෙන් පාඨයක් මෙසේ ය:

"බවුතිසාරුකරන්ඩ ලමයින් ඇති අයවල් ලමයින් වඩාගන මෙහෙ ඉස්සරහට එන්ඩ පුළුවන... අපිත් අපෙ දරුවරුත් පාපයෙන් පිලිසිඳ උපන් නිසාඃ අපි උදහසයට පැමිනි පුත්‍රයොයැ ඉන්නිසා දිව්ව රාජ්ජයට ඇතුල්වෙන්ඩ අපි අළුතෙන් උප්පාදවුනෙමුනම් පුළුවන්වා මීසකඃ වෙන කොයිප්‍රකාරයකින්වත් බැරිය යන වගඃ අපේ ප්‍රානයෙ අසුඬකම පෙන්වන ජලදාරාඉසීමෙනුත් කිමිඳුවීමෙනුත් අපට උගන්වමින් අපටම අපිරිය වෙන්ඩත් දෙවියන්වහංස ඉදිරියෙ පාත්බහින්ඩත් අපේ පවිස්ත්‍රවීමත් ගැලවීමත් අපට පිටතින් හරිකරන්ඩත් අපව දැනමුතුකරන්නායැ."

1746 දී පළ වූ, විල්හෙල්ම් කොන්යින් විසින් පරිවර්තිත දේශනා සතරින් ගත් පාඨයක් මෙසේ ය:

"දෙවියන්වහංශෙට අපව සාදකරන්ඩත් සැකයක් නැතුව උන්වහන්ශෙ ලඟට අපව ලංකරංඩත් තමුංගෙ හ්‍රිදයෙන් අප වෙනුවට ඇපකාරයාවෙන්ඩ ආඥුස්වරුංනෙන්වත් මනුස්පයිංනෙන්වත් යෙසුස් ක්‍රිස්තුස්වහංශෙ ලඟට මීස කාවත් ලඟට නොයවුව. උඹලායෙ ධෛයර්‍යට සාධාරණයට නොඇලෙවුව. විස්වාස නොවවුව එහෙත් උඹලාගෙ උතුම්වූ සර්වප්‍රාක්‍රමවූ ගැලවුම්කාරයාගේ මහිමතාවයද පිහිටද පිනිස උන්වහංශෙටම යාඥාවෙයවුව. කතොලික රොමානුස්වරුං කැටුව උඹලායෙ සමානකාරයිං කොට ආඥුස්වරුංද නැහුනු සුඩයිඥ උඹලායෙ ගැලවිලෙල පිනිස තමුංගෙ ආත්මවල් උකහට තබන ඇපකාරයින් කොට මස්ස පූජාකාරයිඥ නොසොයවුව."

මේ උදාහරණ සියල්ල ම ලන්දේසි යුගයේ ලිඛිත/ පරිවර්තිත පොත්වලිනි. ඒවා පැහැදිලි ව ම සිංහල ගද්‍ය ව්‍යවහාරයට ආවේණික තාලානුරූප ගලා යාමෙන් තොර බව **අමාවතුර**, **පන්සියපණස් ජාතක පොත** හෝ **සද්ධර්මරත්නාවලිය** වැනි සම්භාව්‍ය සිංහල ගද්‍ය කෘතියක භාෂාව හා සැසඳීමෙන් ස්ඵුට වේ. මේවායේ දක්නට ලැබෙන ඇණහිටිනසුලු, නීරස, අවලස්සන මෙන් ම අදක්ෂ යැයි කිව හැකි සිංහල රචනා ශෛලිය සම්මත සිංහල ව්‍යවහාරයෙහි පරිචයක් නොමැති වීමේ ප්‍රතිඵලයකි. ලන්දේසි ජාතික ලේඛකයා/ පරිවර්තකයා මුල් බසේ වාක්‍ය/ වාක්‍යාංශවල වූ අර්ථමය ඒකක මුල් බසට ආවේණික වාක්‍ය වින්‍යාස රීති හා අනුකූල වෙමින් සිංහල අර්ථමය ඒකකවලට නැංවීම මේ අව්‍යක්ත ව්‍යවහාරය පැන නැඟීමට හේතු වූ බව පෙනේ. කිසි යම් භාෂක සමාජයක සාමාජිකයකු තත් සමාජීය භාෂා ව්‍යවහාරයෙහි පරිචයක් අත් පත් කොට ගන්නේ තත් සමාජීය සමූහයෙහි මෙන් ම ඊට පිටු දුන් සංස්කෘතියෙහි ද සාමාජිකයන් වීම මඟින් ය යන්න වාග්විද්‍යාඥයන්ගේ මතය වේ. ඉහත උද්ධෘතවලින් අපට හමු වන ලන්දේසි ජාතික ලේඛකයන්/ පරිවර්තකයන් සිංහල භාෂක සමාජයෙහි හෝ තත් සමාජීය

සමූහයෙහි මෙන් ම ඊට පිටු දුන් සංස්කෘතියෙහි ද සාමාජිකයන් නො වී ආගන්තුක ස්වරූපයකින් සිංහල භාෂාව ප්‍රතිග්‍රහණය කොට ගැනීම හේතුවෙන් සිංහලයේ ආවේණික විශේෂතා පිළිබඳ අවබෝධය ඔවුන් කරා ළං නො වූ බව පෙන්වා දීම අසීරු නො වේ.

මේ උද්ධෘත සියල්ලෙහි ම අක්ෂර වින්‍යාසය සම්මත සිංහල අක්ෂර වින්‍යාස රීතීන්ට පටහැනි බව කිව මනා ය. සිංහලය දීර්ඝ කාලයක පටන් පැවත එන භාෂා ද්විරූපතාවක් සහිත බසකි. සිංහල අක්ෂර වින්‍යාසය වූ කලි ශ්‍රවණය මඟින් නො ව පඨනය හා ලේඛනය මඟින් ප්‍රගුණ කළ මනා ය. මේ නිදසුන්වලින් අපට හමු වන ලේඛකයන් සිංහලය හඳාරා ඇත්තේ ශ්‍රවණය මඟින් පමණක් බවත් කියවීම හා ලිවීම ප්‍රගුණ කොට නොමැති බවත් පැහැදිලි ය. මේ අපභ්‍රෂ්ට යෙදුම් කිහිපයක් හා ඒවායේ නිවැරදි රූප මතු දැක්වේ:

ප්‍රදාන -ප්‍රධාන
ඇදිහිල්ලෙ - ඇදහිල්ලේ / ඇදහිල්ලෙහි
ආරඹයැ - ආරම්භය ය.
සිංහලඅයෙනි - සිංහලයනි /සිහලුනි
ආසෙර්වාද - ආශීර්වාද
අපෙ - අපේ /අපගෙ
අහස්තලින් - අහස්තලයෙන්
අක්ෂු - අක්ෂර /අකුරු
තමූගෙ - තම /ස්වකීය
හ්‍රිද සාක්කිය - හෘද සාක්ෂ්‍යය
දරුවරුත් - දරුවෝත් /දරුවනුත්
ඉන් නිසා - ඒ නිසා
දිව්ව රාජ්ජය - දිව්‍ය රාජ්‍යය
ආත්මවල් - ආත්ම
අයවල් - අය
ඔහු වහංසෙ - උන් වහන්සේ
පවිස්ත්‍ර - පවිත්‍ර
ප්‍රාක්ක්‍රමය - පරාක්‍රමය

මෙබඳු රූප විධිමත් ලේඛන ව්‍යවහාරයට මතු නො ව සම්මත භාෂණ ව්‍යවහාරයට ද පටහැනි වේ. එසේ හෙයින් මෙම ව්‍යවහාර "විශේෂ භාෂණ ස්වරූපයක්" සේ හඳුන්වනු වටී. ආගමික ලේඛන හැරුණු විට අදාළ යුගයෙන් ඉතිරි වී ඇති දැන්වීම් පත්‍රිකා (ලන්දේසි - PLACAATEN = ඉංගිරිසි -Placard) සම්බන්ධ අධ්‍යයනයක නිරත වූ එස්. එල්. කැකුලාවල එහි ලා උපයුක්ත භාෂා ව්‍යවහාරය Super Collquial ව්‍යුහයක් සේ හඳුන්වයි.[106] ඒවා වර්තමාන භාෂණ ව්‍යවහාරයෙන් ද ඈත් වූවක් වීම මේ නිගමනය තහවුරු කරයි.

ශබ්දයෝග විචාරානුකූල ව සලකන කල මේ ව්‍යවහාර සිංහලයට ආගන්තුක ශබ්දයෝග රටා කිහිපයකින් සමන්විත බව පෙනේ. සිංහලය වූ කලි බහුව්‍යඤ්ජන රටාවලින් තොර ස්වර ව්‍යඤ්ජන වින්‍යාසයක් සහිත බසකි. මධ්‍ය සිංහල යුගයේ පටන් පදිම දෙකක සන්ධානය වූ තන්හි පමණක් මධ්‍ය ද්විව්‍යඤ්ජන රටා වර නැඟීම් සිංහලයට පිවිසි අතර සංස්කෘත, පාලි හා දෙමළ බලපෑම් නිසා ද්විවර්ණ හා ත්‍රිවර්ණ ව්‍යඤ්ජන සංයෝග සහිත තත්සම වාඞ්මාලාවක් සිංහල ලේඛන ව්‍යවහාරයට පිවිසිණි.[107] ලේඛනය හා භාෂණය අතර පවත්නා ද්විරූපතාව හේතුවෙන් එම ව්‍යවහාර අතරමැදි රූප ගණනාවකින් යුතු ව භාෂණයෙහි ලා භාවිත වනු දැකිය හැකි ය. (උදා: සූත්‍ර (cvccv)[108] (සංස්.) > සුත්, සුතුරු (ලේඛන සිංහලය), සූත්තර (භාෂණ සිංහලය); ශාස්ත්‍ර (cvcccv) (සංස්.) > සත්, සතර (ලේඛන

106. Kekulawala, S. L., (1976), "Some Linguistic Features of the Eighteenth Century Sinhala Placaaten of Dutch", *Historical Essays*, Colombo: 33.
107. බලගල්ලේ, 1996: 74.
108. වරහන් තුළ දැක්වෙනුයේ ස්වර-ව්‍යඤ්ජන සංස්ථිතිය යි. (v= ස්වර, c= ව්‍යඤ්ජන)

සිංහලය), සාස්තර, සැස්තර (භාෂණ සිංහලය)). කොම්පඤ්ඤ (cvccvccv), ග්‍රීක්ෂ (ccvccv), ග්ලාත (ccvcv)වරුන්, ක්‍රිස්තොප් (ccvccvc), දොර්ණ්හැයිම් (cvcccvcvc), පාද්‍රී (cvccv), ක්‍රීස්තුස් (ccvccvc), ස්ප්‍රිතු (cccvcv), මර්ක්කුස් (cvcccvc), ක්‍රිස්තියානි (ccvccvcvcv), ගොවැර්ණ්ණදෝරු (cvcvcccv) ආදිය ක්‍රිස්තියානි/ කතෝලික සිංහල සාහිත්‍යයෙන් අපට හමු වන බහුව්‍යඤ්ජන සංයෝගවත් රූප කිහිපයකි.

සිංහලය, මධ්‍ය බහුස්වර රටා සහිත භාෂාවක් නො වේ. පුරාණ සිංහලයෙහි එක ම අවස්ථාවක තවඅ (cvcvv), ගජඅ (cvcvv) යන රූප මධ්‍යබහුස්වර රටා සහිත ව ලියවී ඇති අතර එය භාෂා පරිණාමයේ විශේෂ ලක්ෂණයක් සේ සැලකෙයි.[109] එබඳු මධ්‍යස්වර (ව්‍යඤ්ජන ලෝපයෙන් එක ම පදයෙහි උද්වෘත්ත හෝ පද දෙකක සන්ධානයේ දී පූර්ව හා අපර වසයෙන් හමු වන) සන්ධානය වී පැවතීම සිංහල රීතිය යි. සන්ධාන නො වූ මධ්‍යස්වර සහිත පද අපට අදාළ ලේඛනයන්ගෙන් හමු වේ. එවුඅන්ගෙලිය/ එවුඅන්ජෙලිස්ත/ එවුඅන්ජෙලිය, එම්මානුඇල්, යොආබිම් ආදි රූප ඊට නිදසුන් වේ.

මේ සියලු ම පාඨ සිංහලයේ සම්මත අක්ෂර වින්‍යාසයට පටහැනි වන අතර සාවද්‍ය කර්තෘ - කාරක පද හා උක්තාඛ්‍යාත සම්බන්ධතාවෙහි ව්‍යාකූලතා ද සහිත ය. ඉහතින් දක්වන ලද පරිදි මේ වූ කලි සිංහලයේ පවත්නා ද්විරූපී ස්වභාවය පිළිබඳ නො වැටහීම ද ශාස්ත්‍ර පරිහාණිය හේතුවෙන් විධිමත් ලේඛන ව්‍යවහාරය පුහුණු කළවුන් නොමැති වීම ද නිසා උද්ගත වූ තත්ත්වයකි.

පදකයෝග රටාව සම්බන්ධයෙන් ද සිංහලයේ ව්‍යක්ත ව්‍යවහාරයට පටහැනි වර නැඟීම් පිළිබඳ නිදසුන් මේ ලේඛනවලින් ඉදිරිපත් කළ හැකි ය. මධ්‍ය සිංහල යුගයේ අවසානයෙහි පමණ සිට, අචේතන ගණයේ නාම පදයන්හි ඒක - බහු සංඛ්‍යා භේදය ප්‍රකාශ කිරීම අවශ්‍ය වූ කල යොදා ගැනුණු, දෙමළ බලපෑමෙහි ප්‍රතිඵලයක් සේ සැලකෙන, -වල් ප්‍රත්‍යය අචේතන - සචේතන භේදයකින් තොර ව හා සිංහල පදයන්හි ඒක - බහු සංඛ්‍යා රූප පිළිබඳ අනවබෝධයෙන් යුතු ව උපයෝගි කොට ඇති ආකාරය දැකිය හැකි ය:

අයවල්, අයවලුනි, ආරංචිවල්ය, ජඹුරුවල, සැබෑවල්, සුමන්දුවල,
අනාඥාවල්, දේසනාවල්යැ, ක්‍රියාවල්, තෝත්‍රුවල්, වචනවලෙහි,
මස්තකවල්හි

මතු දැක්වෙන නිදර්ශන ද සිංහලයේ පදකයෝග රටා සම්මත බිඳුණු අවස්ථාවලට නිදසුන් ය:

ඔහුට ප්‍රීතිය නොකෙරෙව්වොත් (ඔහු)
ඔහු තුලෙත් ජීවිතය උන්වහංශෙයැ (තුළ)
ඉන්නිසා (ඒ නිසා)
දරුවරුන්ඩ (දරුවන්ට)

---

109. ක්‍රි.ව. සිව් වන ශතකයට අයත් නාගිරිකන්ද ගිරි ලිපියේ මේ රූප හමු වෙයි: Paranavitana, S.(1943), "Nagirikanda Rock Inscription of Kumaradasa", in S. Paranavitana ed., *Epigraphia Zeylanica*, Vol.III, Colombo: 119.

මහිමතාවය (මහිමය)
උඹලායේ (උඹලාගේ)
සමානකාරයිං (සමානයන්)
ඇදහිලිකම (ඇදහිල්ල)
ස්ත්‍රීවරුන්ට (ස්ත්‍රීන්ට)
තිබෙන්ඩ (තිබෙන්නට / තිබෙන්ට)
සික්ෂයින්ඩ (ශිෂ්‍යයන්ට / සිසුන්ට)
මනුස්පයින්ඩ (මනුෂ්‍යයන්ට / මිනිසුන්ට)
කරංඩ (කරන්නට / කරන්ට)

මීට අමතරව, භාෂණ ව්‍යවහාරයට පමණක් සීමා වූ නැතක්, බහදෙනවා, වැහුම් ඇරෙන, නුරුස්සන්ඩත්, නිම්මයක්, මුලාසි නොව, නලංගුවක්, ජඹුර ආදි පද ද දීප්ති වෙනුව, දීප්ති කරන්නා වූ, යාඥාවෙඤමුව ආදි, සිංහලයේ ක්‍රියා පදයක් සේ වර නැඟීමට අවසර නොමැති පද ද මේ ලේඛනවලින් හමු වෙයි.[110]

ලන්දේසි යුගයේ ක්‍රිස්තියානි සාහිත්‍යයෙන් අපට හමු වන යුරෝපීය භාෂාමය වචන ද රැසකි. සිංහල සංස්කෘතියට ආගන්තුක සංකල්පාවලියක් ඉදිරිපත් කිරීමේ දී නව සංකල්ප අයත් වන සංස්කෘතියෙන් ණයට ගත් වචන මාලාවක් උපයෝගි කර ගත යුතු වීම මේ නව වචන මාලාව සිංහලයට පිවිසීමේ හේතුව විය.[111]

ආඥු (< පෘතුගීසි anjo = සුරඟන), බවුතිසාරු (< පෘ. boutizer) වැනි පෘතුගීසි බසින් හින්න වූ පද ද මීරා (< ලතින් mirra = සුවඳ ලාටු), තැම්පෙල (< ලතින් templum = දේවස්ථානය), සිනගොගිය (< ලතින් Syngoga = සම්මුතිය / සම්මුති ශාලාව) ආදි ලතින් බසින් බිඳුණු පද ද, ග්‍රීක භාෂාවෙන් බිඳ ගත් ප්‍රොසෙලූත (< proselutos = තම ආගම අත් හැර වෙනත් ආගමක් වැලඳ ගත් තැනැත්තා), ලොගෝකය (< legion = මහා හමුදාව), පාස්කු (< paschu = සමා කාලය) වැනි පද ද ඒ අතර වෙයි. මින් සමහරක් සිංහල ක්‍රිස්තියානි සංස්කෘතියෙහි මුල් බැස ගත් ඒවා බවට පත් වී තිබේ.

රෝමානු අක්ෂරමාලාවන්හි F අක්ෂර රූපයෙන් නිරූපිත දන්තෞෂ්ඨ්‍ය අඝෝෂ ව්‍යඤ්ජනය සහිත පද තත්සම වසයෙන් සිංහල ලේඛනයට පිවිසෙනුයේ ද ලන්දේසි යුගයෙහි පරිවර්තිත ක්‍රිස්තියානි ධර්මග්‍රන්ථ ඇසුරෙනි. එසේ ද වුව ඒ සඳහා විශේෂ සංකේතයක් භාවිතයට ගැනීමට එකල උනන්දුවක් පැවති බවක් නම් නො පෙනේ. මුද්‍රිත ග්‍රන්ථයන්හි ඒ සඳහා උපයෝගි කොට ගෙන ඇත්තේ ඖෂ්ඨ්‍ය අඝෝෂ ස්පර්ශ මහාප්‍රාණ ව්‍යඤ්ජනාක්ෂරය සඳහා භාවිත වන අක්ෂර රූපය (ඵ) යි. පෘතුගීසි හා ඉංගිරිසි J අක්ෂර රූපය මඟින් නිරූපිත ජ් ශබ්දය ලන්දේසි පරිවර්තනවල දී අපට හමු වන්නේ ලන්දේසි J = ය් (ග්‍රීක ඉයෝටා හා හීබ්‍රෲ යොද් = ඉංගිරිසි Y) ශබ්දයෙන් නිරූපිත ශබ්දයට අනුකූල ව ය. යේසුස් වහන්සේ, යෙරුසලම, යොහාන්, යෝකිම් (යෝආබිම්), යොහැන්නස් ආදි පද සකස් වී ඇත්තේ ඒ නියරිනි. බයිබලය යන යෙදුම පවා ඕලන්ද බසෙහි bijbel යන්නෙන් සිංහලයට බිඳ ගත්තකි.

110. සමකාලීන සිංහල ලේඛකයන් ද මේ අන්දමේ භාෂණ සිංහලයට ළං වූ අව්‍යක්ත සංස්කෘත ව්‍යවහාර හා දෙමළ, පෘතුගීසි යෙදුම් සහිත භාෂා ශෛලියක් භාවිත කළ අයුරු රාජාවලිය වැනි ග්‍රන්ථයක් පිරික්සීමෙන් හෙළි වේ. රාජාවලිය, ඒ. වී. සුරවීර සංස්, (1976), කොළඹ: 5 පරි.

111. බලගල්ලේ, 1996: 57 - 59 හා 64 - 65.

ඉහතින් සාකච්ඡා කෙරුණු භාෂා ලක්ෂණ 1813 දී පළ වූ ශ්‍රී රාමපුර මුද්‍රණය සම්බන්ධයෙන් ද එලෙසින් ම අදාළ වන අතර එහි හමු වන අනවශ්‍ය මූර්ධන්‍යෂ කාර භාවිතය විශේෂයෙන් අවධානයට ලක් කළ මනා ය. ක්‍රිස්තුන් වහන්ෂෙගෙ, දෙවියන් වහන්ෂෙගෙ, ස්වාමිදුරුවානන් වහංෂෙගෙ, උන්වහන්ෂෙගෙ, උන්නාංෂෙට, වහන්ෂ, දිෂ්න වැනි යෙදුම් එහි සුලබ ව හමු වේ.

1817 දි එළි දැක්වුණු කොළඹ බයිබල සමාගමයේ නව ගිවිසුම් පරිවර්තනය එකුන් විසි වන සියවසේ සිංහල භාෂා භාවිතය සම්බන්ධ පැහැදිලි කඩඉමක් සේ හැඳින්විය හැකි ය. "එහි ඉඳහිට පෙනෙන වියරණ දොස් හා අනවශ්‍ය සංස්කෘත ව්‍යවහාරය" නො සලකතොත් "රචනා විලාසයේ උදාරත්වය හා වාංමාලාවේ උචිතත්වය" ද හේතුවෙන් අගය කළ මනා පරිවර්තනයක් සේ සැලකෙයි. එම භාෂා විලාසය පැරණි සිංහල ගද්‍ය ග්‍රන්ථයක භාෂා විලාසය සිහි ගන්වන්නක් සේ අගය කෙරේ.[112] ටොල්ෆ්රිගේ බයිබල පරිවර්තනය මෙතෙක් සිංහල බෞද්ධ සන්දර්භයක ලා භාවිත වූ මිශ්‍ර සිංහල රචනා රීතිය ක්‍රිස්තියානි සන්දර්භයක ලා ඉදිරිපත් කිරීමක් සේ හැඳින්විය හැකි ය. දීර්ඝ කාලයක් තිස්සේ ආඛ්‍යාන ශෛලියක් ගොඩ නගා ගැනීමට ඉවහල් කොට ගැනුණු මේ භාෂා රීතිය ටොල්ෆ්රි හා සහායකයන් විසින් ප්‍රශස්ත අයුරින් හසුරුවා ඇති බවත්, එහි ලා හමු වන ව්‍යාකරණ දෝෂ තත්කාලීන ශාස්ත්‍රීය පසුගාමිත්වය හේතුවෙන් සිංහල ව්‍යවහාරයට ආවේණික ව පැවති දුර්වලතා වසයෙන් හැඳින්විය හැකි බවත් කිව මනා ය. "සිංහල වචනවල ව්‍යඤ්ජනා ශක්තිය පිළිබඳ ව සියුම් හැඟීමක් ටොල්ෆ්‍රි මහතාට තිබුණ බව ඔහුගේ පරිවර්තනයෙන් ස්ඵුට වේ" යනු මේ සම්බන්ධයෙන් එදිරිවීර සරච්චන්ද්‍ර දක්වන මතය යි. "ඔහුගේ භාෂා විලාසය පැරණි සිංහල ග්‍රන්ථයක එන ගද්‍යයේ ස්වරූපය දරයි. ටොල්ෆ්‍රි මහතා සිංහල සාහිත්‍යයේ හසළ බුද්ධිමතකු බව ය පෙනෙන්නේ" යනු සරච්චන්ද්‍රෝක්ති යි.[113]


දෙවියන්වහන්සේගේ පුත්‍රවූ ජේසුස්ක්‍රිස්තුස්වහන්සේගේ
මංගල්‍යප්‍රකාශනායගේ පටන්ගැන්මය. බලව මාගේ දූතයා
තාගේ අභිමුඛයට එවමි; හෙතෙම තට පෙරටුව තාගේ
මාර්ගය සාදනේයයි කියාද, ස්වාමිවහන්සේගේ
මාර්ගය සාදව් උන්වහන්සේගේ මාර්ගය පාදු කරව්යයි
වනාන්තරයෙහි හඬගසන්නාහුගේ ශබ්දයයි කියාද අනාගත
වක්තෘවරුවිසින් ලියනලද ප්‍රකාරයෙන්, යොහන්තෙම
වනාන්තරයෙහිදි අවගාහණය කරමින් පාපයන්ගෙන් මිදීම
පිනිස පශ්චාත්තාපයෙහි අවගාහනය ඝොෂණය කරමින්
ආයේය. එවිට යූදයරටවාසි සියල්ලෝද යෙරුසලමෙ
වැසියෝද ඔහු කරා නික්මී ගොස් තමන්ගේ පාපච්චාරණය
කොට යොර්දන් ගඟාවෙහිදී ඔහුගෙන් අවගාහණය ලද්දා
හුය. යොහන් වනාහි ඔටුරෝමමය වස්ත්‍ර හඳනාවූ කටි
යෙහි සම්පටියක් බඳනාවූ පලහැටියන්හා වනාමීපැණි අනු
භව කරනාවූ තැනැත්තෙක. හෙතෙම, මට වඩා බල
වත් කෙනෙක් මට පසුව එනසේක උන්වහන්සේගේ පාදු
කාවන්ගේ පටිය නැමී මුදන්ට මම නොවටිනෙමි. මම
වනාහි ඔබට ජලයෙන් අවගාහණය කොලෙමි එහෙත්
උන්වහන්සේ තොප සුද්ධාත්මයෙන් අවගාහණය කරණ
සේකැයි ඝොෂණය කොළේය.

112. සරච්චන්ද්‍ර, 1951: 35-36.
113. එහි ම, 36.

ටොල්ෆ්‍රිගේ නව ගිවිසුම් අනුවාදයේ අග එහි ලා උපයුක්ත සංස්කෘත පදවලට අදාළ ගැටපද විවරණයක් එයි. ඒ වූ කලී සිංහලයේ ලේඛන භාෂණ උභය ව්‍යවහාරයෙහි පරිචිත පඬිවරයකුගේ වෑයමක් සේ හැඳින්විය හැකි ය.

කොළඹ බයිබල සමාගමය විසින් ප්‍රකාශිත පැරණි ගිවිසුම අනුවාදය ද පූර්වෝක්ත භාෂා ලක්ෂණ විදහා පායි. ඉහතින් සාකච්ඡා කරන ලද ලන්දේසි බයිබල පරිවර්තන හා සසඳන කල මේ පරිවර්තන සිංහල සාහිත්‍යයේ කනිෂ්ඨ ගද්‍ය ග්‍රන්ථාගත භාෂා විලාසයෙහි[114] ම අවස්ථාවක් සේ හැඳින්විය හැකි ය. ඇතැම් විට බෞද්ධ භික්ෂූන් (?) හා දේශීය උගතුන් ද මීට සහාය පළ කිරීම මෙහි භාෂා විලාසයෙහි ස්වරූපය කෙරෙහි බල පාන්නට ඇතැයි නිගමනය කිරීම අසීරු නො වේ. දිගු කලක් "අපභ්‍රෂ්ට තත්ත්වයක තිබූ සිංහල භාෂාව පළමුවෙන් ම සාහිත්‍යික කටයුතුවලට යොදන්ට තැත් කිරීම" සම්බන්ධයෙන් සරච්චන්ද්‍රගේ ඇගයීමට පාත්‍ර වී ඇති බයිබල පරිවර්තකයන් අතරින් කොළඹ බයිබල සමාගමයේ පරිවර්තක මණ්ඩලය ප්‍රමුඛස්ථානය ගන්නා බව පැවසිය යුතු ය. පහත දැක්වෙනුයේ කොළඹ බයිබල සමාගමයේ පැරණි ගිවිසුම් පරිවර්තනයෙන් උද්ධෘතයකි.

> යෙහොවඃ දෙවියන්වහන්සේ විසින් ක්ෂෙත්‍රයෙහි ම
> වනලද සියලු සත්ව ජාතීන්ට වඩා සර්පයාතෙම ප්‍රයෝගකාරයෙක්
> විය. හෙතෙමේද උයනෙහි සියලු වෘක්ෂවලින් තොපි අනු
> භව නොකරව්යයි සැබැවින් දෙවියන්වහන්සේ කීසේක්දැයි
> ස්ත්‍රීයගෙන් ඇසීය. ස්ත්‍රී වනාහි උයනෙහි වෘක්ෂයන්
> ගේ ඵල අපි අනුභව කරන්ට හැකිවම්හ. එහෙත්
> දෙවියන්වහන්සේ උයනමධ්‍යයෙහි තිබෙන වෘක්ෂයාගේ
> ඵල තොපි නොනසින පිනිස එයින් අනුභවද නොකරව්
> එක සපර්ශද නොකරව්යයි වදාළසේක. සර්පයාතෙමේද
> තොපි සැබවින් නොනසිනාහුයයි ස්ත්‍රීයට කීය. කුමක්
> හෙයින්ද තොපි එයින් අනුභවකල දවසෙහි තොපගේ ඇස්
> ඇරී තොපි යහපතද අයහපතද දැනගනිමින් තොපි දෙවි
> යන් සමාන වන්නාහුයයි දෙවියන්වහන්සේ දන්නාසේක.
> යලිත් ස්ත්‍රීතොමෝ ඒ වෘක්ෂයාගේ ඵල භොජනයට යහපත්
> බවද ඇස්වලට ප්‍රියව තිබෙන බවද නුවණ දෙන්ට ආසා
> ඇති වෘක්ෂයක්බවද දැක එයින් ඵල ගෙන අනුභව
> කලාය. තවද ඈ සමග සිටි ඈගේ ස්වාමිපුරුෂයාටද දුන්
> නාය. හෙතෙමේද අනුභව කෙලේය. ඉක්බිති ඔවුන්
> දෙදෙනාගේ ඇස්ඇරී ඔවුන් නග්නව සිටිබව දැනගත්තෝය
> ඔවුන් වනාහි උදුම්බර පත්‍ර එකතුව මසාමින් තමන්ට වළ
> වැසුම් සාදගත්හ. එවිට දිනයාගේ සීතකාලයෙහි යෙ
> හොවඃ දෙවියන්වහන්සේ උයනෙහි සක්මන් කරනා ශබ්දය
> ඔවුන්ට ඇසුණේය. එකල ආදම්පෙම තමන් භාර්යාව
> සමග යෙහොවඃ දෙවියන්වහන්සේගේ අභිමුඛයෙන් උය
> නෙහිවූ වෘක්ෂමධ්‍යයෙහි තමන්ම සැඟවුනාහුය. යෙ
> හොවඃ දෙවියන්වහන්සේ [illegible]

114. රාජාවලිය, සුරවීර, 1976: 33-34; සුරවීර, ඒ. වී., (1996), සිංහල ඉතිහාස ලේඛන - සංස්කෘතික පුස්තිකා මාලා - 2, බත්තරමුල්ල: 31-32.

කොළඹ බයිබල සමාගමයේ පරිවර්තනය නිකුත් වීමත් සමඟ ලැම්බ්‍රික් හා සෙල්ක්‍රික් විසින් මතු කරන ලද ප්‍රශ්නය සිංහල ගද්‍යාඛ්‍යානයන්හි රචනා රීතිය සම්බන්ධ විවාදාපන්න ප්‍රශ්නයක් සේ හැඳින්විය හැකි ය. ටොල්ෆ්‍රි ආදීන්ගේ පරිවර්තනය සංස්කෘත පද බහුල කයෝ්ර රීතියකින් යුක්ත වීම හේතුවෙන් එය සාමාන්‍ය ජනයාගේ සුබග්‍රහණධාරණයට යෝග්‍ය නො වෙති යි යනු ඔවුන් දැරූ මතය විය. ඔවුන්ගේ බයිබල පරිවර්තනය (= කෝට්ටේ අනුවාදය) සිංහලයේ භාෂණ හෝ ලේඛන ව්‍යවහාර ද්වයයෙන් එකකට දූ අයත් නො වන්නක් සේ හැඳින්විය හැකි ය. භාෂාමය ද්විරූපතාවක් සහිත සිංහලයේ භාෂණ ලේඛන ව්‍යවහාර ද්වයය අතර ඇති ප්‍රධාන විසමතාව නම් ඒ ඒ දෙක්හි ලා වෙන් වෙන් වාඞ්මාලා උපයුක්ත වීමත්, ලේඛනයෙහි ලා අපේක්ෂිත පුරුෂ, සංඛ්‍යාදි භේදානුරූපී උක්තාඛ්‍යාත අනුරූපතාව නො සලකමින් භාෂණයෙහි ලා කවර පදයක් උක්ත වුව ද එක ම ආඛ්‍යාත පදයක් භාවිතයට ගැනීමත් ය.[115] කෝට්ටේ අනුවාදකයෝ සිය භාෂා ශෛලිය සාරල්‍යයට පත් කිරීමේ අරමුණින් උක්තය වසයෙන් යෙදෙන පදයේ සංඛ්‍යා පුරුෂාදි ලක්ෂණ නො සලකා ඒ සමඟ භාෂණ ව්‍යවහාරාගත ආඛ්‍යාත රූප යෝජනය කොට වාක්‍යාවසානය සඳහා -ය නිපාතයක් එක් කළෝ ය. මේ භාෂා ස්වරූපය කෝට්ටේ අනුවාදකයන් විසින් අමුතුවෙන් සකසා ගත්තක් නො වන බවත් රාජාවලිය ඇතුළු මහනුවර යුගයේ ගද්‍ය ග්‍රන්ථයන්හි මෙන් ම මුද්‍රිත සන්නිවේදන මාධ්‍යයේ ආරම්භක යුගයේ දීත් දැකිය හැක්කක් බව සඳහන් කළ මනා ය. රාජාවලියෙහි දැකිය හැකි වන්නේ සංඛ්‍යා, ලිංග, පුරුෂාදි භේද නො සලකා ක්‍රියා නාමයන්ට -හ ප්‍රත්‍යය එක් කරමින් වාක්‍යාවසානය සිද්ධ කිරීම යි.[116]

අප විසින් ඉහතින් දක්වන ලද පරිදි ජේම්ස් අල්විස් ආදීහු කෝට්ටේ අනුවාදය එය පළ කෙරුණු අවධියේ දී ම විවේචනයට ලක් කළෝ ය. මෙහි භාෂා ශෛලිය ආගමික විෂයයකට නො ගැළපෙන්නක් සේ හැඳින්වූ අල්විස් ව්‍යාකරණ දෝෂ මෙන් ම උපයුක්ත වාඞ්මාලාවෙහි අයෝග්‍ය බව ද කෙරෙහි අවධානය යොමු කෙළේ ය. සර්වබලධාරී දෙවියන් වහන්සේ හැඳින්වීම සඳහා ගෞරවාර්ථවාචී උපපද රහිත ව "දෙවියෝ", "දෙවියන්" යනුවෙන් යෙදීමත් Thou යන ඉංග්‍රීසි මධ්‍යම පුරුෂ නියෝජ්‍ය නාමපදය "තෝ" යනුවෙන් සිංහලයට නඟා තිබීමත් නිසා එය සර්වබලධාරී දෙවියන්ට අපහාසාත්මක ව ලියවුණක් ය යන විරෝධය ද ඒ කෙරෙහි එල්ල විය. දෙවියන් වහන්සේගේ පුත්‍රයා හැඳින්වීම සඳහා ද ගෞරවාර්ථවාචී උපපදවලින් තොර "යේසුස් ක්‍රිස්තුස්" යන පුද්ගල නාමය භාවිත කොට තිබීම ද ක්‍රිස්තු ලබ්ධික උගතුන්ගේ විවේචනයට ලක් විය. මෙහි ග්‍රන්ථ නාමය පවා දැක්වෙනුයේ "යේසුස් ක්‍රිස්තුස්ගේ අළුත් ගිවිසුමය" යනුවෙනි.

එසේ වුව ද කෝට්ටේ අනුවාදය මුළුමනින් ම ලිඛිත ව්‍යවහාරය පිටු දැක ලියවුණක් සේ හැඳින්විය හැකි නො වේ. එහි ඇතැම් තැන ලේඛන ව්‍යාකරණය අනුගමනය කර තිබේ. මෙහි තව ද සාධනීය ලක්ෂණ කිහිපයක් කෙරෙහි අවධානය යොමු කළ මනා ය. පරිවර්තකයන් පොදු ජනයාට වැටහෙන භාෂා රීතියක් කරා නැඹුරු වීම එහි ලා විශේෂයෙන් සඳහන් කළ යුතු ය. භාෂණ ව්‍යවහාරාගත වාක්කෝෂය භාවිතයට ගැනීම ඒ සඳහා අනුදත් ප්‍රධාන මාර්ගය වුව ද එහි ලා ඖචිත්‍යය කෙරෙහි සැලකිලිමත් නො වීම හේතුවෙන් ඔවුන්ගේ භාෂා රීතිය අව්‍යක්ත මෙන් ම ග්‍රාම්‍ය ද බවට පත් විණැයි කිය හැකි ය. කොළඹ බයිබල සමාගමයේ පරිවර්තනය හා සසඳන කල කෝට්ටේ පරිවර්තනය කෙටි වාක්‍යවලින් යුක්ත වීම ද තවත් සාධනීය ලක්ෂණයක් සේ හැඳින්වුව මනා ය.

115. බලගල්ලේ, විමල් ජී., (1995), භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය, කොළඹ: 95-99.
116. රාජාවලිය, සුරවීර, 1976:142.

පහතින් දැක්වෙනුයේ කොළඹ හා කෝට්ටේ අනුවාදයන්හි සංසන්දනයකි.



වර්ෂ 1855 දී පළ වූ නව පරිවර්තනය ද, භාෂා භාවිතය අතින් තෘප්ත විය හැකි පරිවර්තනයක් නො වී ය. කෘදන්ත රූප භාවිතය පූර්ව පරිවර්තනවලට ද වඩා අව්‍යක්ත විය. හීබ්රු බසෙහි කර්ම කාරක රූප හා ග්‍රීක කර්තෘ කාරක රූප වඩාත් අව්‍යක්ත ව සිංහලයට පෙරළා තිබිණි (පලයල්ලා ආදි යෙදුම්). සියවසක් පමණ කාලයක් තිස්සේ පැවති බයිබල පරිවර්තන සම්බන්ධ විවාදය ද නො සලකා මෙහි ද ව්‍යාකරණ විරෝධී හා ග්‍රාම්‍ය රූප යොදනු ලැබ තිබිණි. මේ අවධියේ විසූ මිෂනාරීන්ගෙන් ඇතැමෙක් සිංහලය පිළිබඳ සැලකිය යුතු උගත්කමක් ඇත්තෝ වූහ. එහෙත් ඔවුන්ගේ එම උගත්කම අසම්පූර්ණ වූවක් සේ හැඳින්විය යුතු වෙයි. ඔවුන්ගේ භාසාව සුබෝධකර වූවක් නො වී ය. සිංහලයේ ගෞරවාර්ථ නාමපද හා යෙදෙන ක්‍රියා රූපයන්හි නිරවද්‍ය භාවිතය මේ පරිවර්තකයන්ට දුෂ්කර වූ බැවින් ඔවුන් එම දුෂ්කරතාව මඟ හරවා ගැනීමට අවියත් යෙදුම් කරා යොමු වූ බව පෙනේ. උඹලා වැනි සර්ව නාම හා කාපල්ලා, වරෙල්ලා වැනි ක්‍රියා රූප නිදසුන් ය. මෙබඳු සිංහල සමාජයේ සෑම ස්තරයක් විසින් ම සාධුත්වයෙන් පිළිගන්නේ නො වේ.

**සමාලෝචනය**

බයිබලයේ සිංහල පරිවර්තන හා කිතුසමයානුගත වෙනත් සිංහල ග්‍රන්ථ සම්පාදනයේ දී මුහුණ පෑමට සිදු වන ගැටලු කිහිපයකි. මේ ග්‍රන්ථ සියල්ල වස්තු විෂය අතින් කිතුසමය හා සමීප වන අතර ඒ වූ කලි බෞද්ධ - හින්දු ලෝක දෘෂ්ටියට අනුකූල ව ගොඩ නැඟුණු භාවමය ලෝකයක් විෂය පථය කොට ගත් භාෂාවක් වූ සිංහලයට මුළුමනින් ම ආගන්තුක වූවකි. අපේක්ෂිත පරිද්දෙන් ම, ප්‍රධාන වසයෙන් ම ආගමික සංකල්ප ප්‍රකාශ කිරීම සඳහා යෝග්‍ය නව්‍ය වචන හඳුන්වා දීමට මේ කාර්යයෙහි පුරෝගාමීන්ට සිදු වූයේ ය. ඒවා "සර්වබලධාරී දෙවියන්" ප්‍රමුඛ කොට ගත් ක්‍රිස්තියානි සංකල්ප හා සබැඳි ඒවා ය. මේ සංකල්ප සඳහා බටහිර භාෂාමය පද තත්සම වසයෙන් භාවිත කිරීම මෙහි ලා අනුගමනය කෙරුණු එක් මඟක් විය. යුරෝපීය භාෂාවලින් ආණීත පද බොහෝ විට සිංහල ප්‍රත්‍යය යෝජනයෙන් සිංහලීකෘත කෙරිණි. මේ අන්දමින් තත්සම, අර්ධ තත්සම හෝ සිංහලීකෘත බටහිර භාෂාමය පද පළමු වරට ඇස ගැටීමේ දී හෝ ශ්‍රවණයේදී හෝ ඒවායේ ඇති නුහුරු බව මෙන් ම ව්‍යාකරණ විරෝධීභාවය ද ප්‍රකට වේ.[117] එසේ වුව ද ඇතැම් වචන පසු කල සිංහල ව්‍යවහාරය හා මැනවින් බද්ධ වී සිංහල වාඞ්මාලාව පෝෂණයහි ද සමත් වූ බව පෙන්වා දෙනු ලැබේ. වාඞ්මාලාව අතින් මතු නො ව ආඛ්‍යාන ශෛලිය අතින් ද බයිබල පරිවර්තනවලින් සැලකිය යුතු මෙහෙවරක් වූ බව කිය හැක්කේ කොළඹ උපකාරී බයිබල සමාගමයේ හා කෝට්ටේ අනුවාද දෙකෙන් නියෝජනය කෙරෙන ආඛ්‍යාන ශෛලි ද්වයය එකුන් විසි වන සියවසේ නව සාහිත්‍යාංගයන්හි ප්‍රභවයට ද මඟ පෑදීමෙහි ලා මහත් බලපෑමක් සිදු කළ බැවිනි. සිංහලය නව අදහස් හා සංකල්ප ප්‍රකාශයට මෙන් ම නව ආඛ්‍යාන විලාස භාවිතයට නම්‍යශීල වූයේ ද මෙහි ප්‍රතිඵලයක් වසයෙනැයි පැවසිය හැකි ය.

---

117. බයිබල පරිවර්තනවල හා වෙනත් ක්‍රිස්තියානි සිංහල ලේඛනවල භාෂා විලාසය කෙරෙහි ජාතික ආගමික පුනර්ජීවන ව්‍යාපාරයේ බලපෑමට හසු වූ උගතුන් දැක්වූ ප්‍රතිවිරෝධය ඔවුන් එම ව්‍යවහාර හැඳින්වීමට භාවිත කළ "ගොන්සාල්විස් සිංහල", "පල්ලි හිංගල", "කතෝලික හිංගල", "බයිබල් හිංගල" යනාදි යෙදුම්හි ගැබ් වෙයි. බලගල්ලේ, 1995: 66.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### 1. බයිබල් පරිවර්තන

අපගෙ නායකවූ ගැලවුම්කාර/ යෙසූස් ක්‍රිස්තුස් වහංසෙගෙ/ සුධවූ එවුඅන්ගෙලිවුමය/ මතෞවුස් මර්කුස් ළූකස් යොහනෙස්/ යන දෙවියන්වහන්සෙගෙන් එවාවදාරණ යෙදුනු අයවල් නැමැති සුධවූ/ එවුඅන්ගෙලිස්තවරුන්ගෙන් ලියවුනු හැටියැ/ 1737, කොළඹ.

සුධවූ අපොස්තුළු පවුළුස් රොමානුස්වරුන්ඩ ලිවූ යැවුන්පත්‍රයැ, 1770, කොළඹ.

එවුඅන්ගේලිස්ත ළූකස් විසින් ලියවුනු අපොස්තුළුවරුන්‍ෙන ක්‍රියාවල් යන පොතයැ, 1771, කොළඹ.

සුධවූ අපොස්තුළු පවුළුස් කොරින්තුස්වරුන්ඩ ලිවූ යැවුන්පත්‍ර දෙකද ග්ලාතවරුන්ඩ ලිවූ යැවුන්පත්‍රයැ, 1773, කොළඹ.

සුධවූ අපොස්තුළු පවුළුස් එෆෙස්වරුන්ඩ පිලිප්පැන්‍ෂවරුන්ඩ කොලොස්සැන්‍ෂවරුන්ඩ තැස්සලොනිසැන්‍ෂවරුන්ඩ සහ තිමොතේඔස්හට තීතුස්සට පිලොමොන්හටද හෙබ්‍රෙවුවරුන්ඩද ලිවූ යැවුන්පත්‍රවල්, 1776, කොළඹ.

සුධවූ අපොස්තුළුවරුන්ගෙ පොදුවූ යැවුන්පත්‍රවල් එනම් යකොබුස්ගෙ එකයි පෙත්‍රුස්ගෙ දෙකයි යොහන්නැස්ගෙ තුනයි යුදස්ගෙ එකයි යොහන්නැස්ගෙ එළිදරවුකෙරීමයි, 1776, කොළඹ.

අපගේ ස්වාමිවූ ගැලවුම්කාර යෙසූස්ක්‍රිස්තුස් වහන්සෙගෙ අළුත් තෙස්තමෙන්තුවෙ සිංහල භාසාවෙ පිටපතය, ප්‍රථම ඛාණ්ඩය, මතෞවුස්ගෙන් ලියවුනු එවුඅජෙලිය, ශ්‍රීරාමපුරෙ අච්චුගසන්නට යෙදුනෙ වර්‍ෂ 1813දීය.

සකල ජනයන්ගේ ගැලවීම පිනිස ප්‍රකාශකරණලද අපගේ සවාමිවූ ගැලවුම්කාර යෙසුස්ක්‍රිස්තුස් වහන්සෙගේ අභිනව ගිවිසුම,' කොළඹ බයිබල සමාගම, 1817.

සුධවූ බැයිබලය/ කොළඹ පුරප්‍රවරයෙහි බැයිබල් සමාගම වෙනුවෙන් සිංහළ භාෂාවට පිටපත් කොට අච්චු ගසන ලදි/ Colombo/ Printed at the Wesleyan Mission Press, 1819 (කොළඹ).

*The New Testament of Our Lord and Saviour Jesus Christ* (Translated into Pali), 1835, Wesleyan Mission Press.

අපගෙ ගැලවුන්කාර සවාමිවූයෙසුස්ක්‍රිස්තුස්ගේ අළුත් ගිවිසුමය, හෙල්ලීන යන මුල් භාෂාවෙන් සිංහල භාෂාවට පිටපත් කරන්ඩ යෙදුනාය, (1832), Ceylon, Church Mission Press, CTTA, (2nd Edition), 1846.

අළුත් ගිවිසුම නම් සුධලියවිලිය, (1862), බැප්ටිස්ට් මිෂියොනාරිස් සමාගම, දෙවන මුද්‍රණය, 1892.

## 2. පොත්

### පැරණි ග්‍රන්ථ

රාජාවලිය, ඒ. වී. සුරවීර සංස්. (1976), කොළඹ.

### නූතන ග්‍රන්ථ

අබයසිංහ, ටිකිරි, (1969), **පෘතුගීසීන් හා ලංකාව**, කොළඹ.

අබයසිංහ ටිකිරි සහ තවත් අය,(1977), **උඩරට රාජධානිය 1470 - 1818**, කොළඹ.

අරසරත්නම්, එස්., (1969), **ලංකාවේ ලන්දේසි බලය (1658 -1687)**, කොළඹ.

පීරිස්, එඩ්මන්ඩ්, (19??), **සිංහල ක්‍රිස්තියානි සාහිත්‍ය වංශය** - (දස හවන සියවසේ සිට දස අට වන සියවස දක්වා), කොළඹ.

බලගල්ලේ, විමල් ජී., (1992), **සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය**, කොළඹ.
(1995), **භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය**, කොළඹ.
(1996), **සිංහල භාෂාවේ ප්‍රභවය හා ප්‍රවර්ධනය**, සංස්කෘතික පුස්තිකා මාලා -5, බත්තරමුල්ල.

වාචිස්සර හිමි, කොටගම, (1960) **සරණඞ්කර සඞ්ඝරාජ සමය**, දෙවන මුද්‍රණය, (1964), කොළඹ.

සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර, (1961), **සිංහල සාහිත්‍ය වංසය**, කොළඹ.

සරච්චන්ද්‍ර, එදිරිවීර, (1951), **සිංහල නවකතා ඉතිහාසය හා විචාරය**, සය වෙනි මුද්‍රණය, 1968, කොළඹ.

සෝමරත්න, ජී. පී. වී. (1962), **ලංකාවේ ක්‍රිස්තියානි ආගම**, නුගේගොඩ.

### ලිපි

පරණවිතාන, සෙනරත්, (1956), "සිංහල භාෂා පරිණාමය", **ශ්‍රී සුමඞ්ගල ශබ්දකෝෂය**, සංස්. වැලිවිටියේ සෝරත හිමි, (කාණ්ඩ දෙකකි.) ද්විතීය භාගය : (ප -ළො), ද්විතීය මුද්‍රණය, 1970, ගල්කිස්ස: 1204 - 1219

## BOOKS

Alwis, James de, (1852), *The Sidath Sangarawa - A Grammar of the Sinhalese Language*, Colombo.

Geiger, Wilhelm, (1938), *A Grammar of the Singhalese Language*, Colombo.

Jurrianase, M. W., (1943), *Catalogue of the Archives of Dutch Central Government of Coastal Ceylon 1640 - 1796*, Colombo.

Malalgoda, Kithsiri, (1976), *Buddhism in Sinhalese Society 1750 -1900*, London.

Murdoch, John and James Nicholsan, (1868), *Classified Catalogue of Printed Tracts and Books in Ceylon*, Madura.

Peiris, Edmund, (1978), *Studies Historical and Cultural*, Colombo.

Perera, S.G., (1941), *The Jesuits in Ceylon (in the xvi and xvii centuries)*, Madura.

*Report of the Colombo Auxiliary Bible Society for the year Ending 30th September 1892*, Colombo. 1893.

Ruel, Joennas, (1708), *Grammatica. of Singaleesche Taal-Kunst Zynde*, Amsterdam.

Sarathchandra, E.R., (1950), *The Sinhalese Novel*, Colombo.

Tennakoon, Vimalananda, (1963), *Buddhism Under the Christian Power*, Colombo.

*The Fifth Report of the Colombo Auxiliary Bible Society*, 1817, MDCCCXVII, Colombo, Wesleyan Mission Press.

Vander Wall, E.H., (n.d), *The Contribution of the Dutch to the making of Ceylon*, Reprinted from *The Journal of the Dutch Burgher Union* for 1932, Colombo.

Wickremasingha, D.M.de Z., (1901), *Catalogue of the Singhalese Printed Books in the Library of the British Museum*, London.

## ARTICLES

Bultjens, A.E., (1886), "On Some Dutch Words Commonly Used by the Sinhalese", *The Orientalist*, Vol.3, 1886: 104-7.

de Silva, K.M., (1973), "Religion and State in Early Nineteenth Century", *U.C.H.C.*, Vol. III, Pt.I, Ch. V: 66-76

Diehl, Katharine Smith, (1976), "Ceylon Students Abroad in Eighteenth Century", *Historical Essays*, Colombo: 13-27.

(1978), " Simon Cat ,Translator 1624 - 1704", *The Ceylon Historical Journal*, Vol.25, Nos. 1-4, October 1978, Dehiwala: 193 ff.

Fox, W.B. (1936), "A Compendium of Ceylon Portuguese Language", *Ceylon Literary Register*, 3rd series, Vol. 4: 281-292.

Geiger, Wilhelm, (1937), "Linguistic Character of Sinhalese" , *J.R.A.S. (C.B.)* Vol. XXXIV, No: 90: 16-43.

Gunasekara, A.M.,(1891), *A Comprehensive Grammar of the Sinhalese Language*, 2nd edition, 1964, Colombo,

Hettiarachchi, D.E., (1964), "Influence of Portuguese on the Sinhalese Language", *J.R.A.S. (C.B.)*-(N.S.), Vol.9:229-238.

Kekulawala, S.L., (1976), "Some Linguistic Features of the Eighteenth Century Sinhala Placaaten of Dutch", *Historical Essays*, Colombo: 28-43.

Nell, Louis, (1886-a), "An Explanatory List of Portuguese Words Adopted by the Sinhalese", *The Orientalist*, Vol.3,1886: 41-56.

(1886-b), " An Explanatory List of Dutch Words Adopted by the Sinhalese", *The Orientalist*, Vol.3, 1886:144-48.

Palm, J.D., (1846-47), "The Educational Establishment of Dutch in Ceylon" , *J.R.A.S. (C.B.)*, Vol.I, No.2: 124f.

(1847-48) , "An Account of the Dutch Church in Ceylon" , *J.R.A.S. (C.B.)*, Vol. 1, No. 3 : 5f.

Paranavitana, S., (1943), "Nagirikanda Rock Inscription of Kumaradasa", in S. Paranavitana ed., *Epigraphia Zeylanica*, Colombo: 115-128.

Perera, S.G., (1915) , "The Jesuits in Ceylon in the 16th and the 17th Centuries", *Ceylon Antiquary and Literary Register*, Vol. 1:220f.

(19??), Portuguese Influence in Sinhalese Speech", *Ceylon Antiquary and Literary Register*, Vol.8: 45 -60, 126 - 144.

Peiris, Edmund, (19?), "A Portuguese - Tamil - Sinhalese Dictionary of the XVIIIth Century", *Ceylon Literary Register*, Vol. 1, No.12: 539-40.

Quere, M., (1984), "Fransis Xavier and Sri Lanka", *Aquinas Journal*, 1.1:161-176.

Somaratna, G.P.V., (1991), " The History of Sinhala Bibfe", *J.R.A.S. (Sri Lanka Branch)*, Vol. XXXIV, (N.S.) 1989/90 :41-64.

Tillekaratne, John F., (1889), "The Life of Karatota Sri Dhammarama, High Friest of Matara in the Southern Province of the Island of Ceylon", *The Orientalist*, Ed. William Goonetilleke, Vol.III: 206.

Weerasingha, S.J. de S.,(1952), "The Sinhala Bible from Early Begining to Our Times", *New Lanka*, O.A.B., No.3: 69 -79.

Wickramasuriya, Sarathchandra, (1978) , "The Beginning of the Sinhalese Printing Press", *Senarat Paranavitana Commemoration Volume*, ed P.L. Prematileke, K. Indrapala, J.E. Van Lohuizen De Leeuw, Leiden, E.J. Brill: 283-300.

Wood House, Edmond, (1884), "Influence of the Portuguese and Dutch Languages on the Sinhalese and Tamil", *The Orientalist*, Vol.1, Oct 1884: 223-26.

(1886), "On Some Portuguese Words Commonly Used by the Sinhalese", *The Orientalist*, Vol.3 , 1886: 214-18.